දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර

மாவட்ட செயலக காரியாலயம் - களுத்துறை

DISTRICT SECRETARIAT – KALUTARA

2024



වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயல்திறன் அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

පටුන

01.පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1.හැඳින්වීම..... 1-9
1.2.ආයතනයේ දැක්ම,මෙහෙවර අරමුණු..... 10-11
1.3.ප්‍රධාන කාර්යයන්..... 12
1.4.සංවිධාන සටහන..... 13
1.5.දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවතින ප්‍රධාන අංශ ප්‍රාදේශීය ලේකම් කාර්යාල..... 14

02.පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1.විශේෂ ජයග්‍රහන,අභියෝග හා ඉදිරි ඉලක්ක..... 15

03.පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1.මූල්‍ය කාර්ය සාධනය..... 16-18
3.2.මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 19-21
3.3.මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය..... 22-25
3.4.මූල්‍ය ප්‍රකාශ සටහන්..... 26-39
3.5.ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය..... 40
3.6.වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීම..... 41
3.7.මු.රෙ.208 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන..... 42-62
3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය..... 63
3.9.විගණකාධිපති වාර්තාව(2024 වර්ෂයේ විසර්ජන ගිණුම පිළිබඳ වාර්තාව -2024 කාර්ය සාධන වාර්තාවේ සිංහල පිටපතට පසුව ඇත.)

04 පරිච්ඡේදය - කාර්ය සාධක දර්ශක

4.1ආයතනයේ කාර්ය සාධක දර්ශක(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)..... 64

05. පරිච්ඡේදය- තිරසර සංවර්ධන අරමුණු (SDG සපුරාගැනීම)

5.1.හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු..... 65-66
5.2 තිරසර සංවර්ධන ළඟාකර ගැනීමේ ජයග්‍රහන හා අභියෝග..... 67

06. පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය..... 68
6.2 මානව සම්පත් හිඟය ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි බලපාන ආකාරය..... 68
6.3. මානව සම්පත් සංවර්ධනය..... 69-71
07.පරිච්ඡේදය-අනුකූලතා වාර්තාව 72-76

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024


1 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

කළුතර දිස්ත්‍රික්කයේ භූගෝලීය පිහිටීම

කළුතර දිස්ත්‍රික් බල ප්‍රදේශයන්හි නිරපේක්ෂ පිහිටීම සලකන විට බටහිරින් සලකන විට බටහිරින් ඉන්දියන් සාගරයෙන්ද උතුරින් සාගරයෙන්ද උතුරින් කොළඹ දිස්ත්‍රික්කයෙන්ද, නැගෙනහිරින් රත්නපුර දිස්ත්‍රික්කයෙන්ද, දකුණු දිශාවෙන් ගාළු දිස්ත්‍රික්කයෙන්ද මායිම් වී ඇත.



එහි සාපේක්ෂව පිහිටීම දළ වශයෙන් උතුරු අක්ෂාංශ $6^0 19^1 30^{11}$– $6^0 49^1 30^{11}$ සහ නැගෙනහිර දේශාංශ $79^0 511 30^{11}$ - $80^0 22^1 45^{11}$ වශයෙන් දැක්විය හැකිය. ප්‍රදේශයේ විශාලත්වය වර්ග කි.මී 1607.6 වන අතර ඉන් වර්ග කි.මී 26.53 ක් අභ්‍යන්තර ජලාශ වන බැවින් ගොඩබිම ප්‍රදේශය වර්ග කි.මී 1581.07 වේ. මුහුදු මට්ටමේ සිට 1000 වන සමෝච්ච රේඛාව දක්වා ක්‍රමයෙන් උස්වූ භූමි ප්‍රදේශයක් තුළ දක්නට ඇත.

කළුතර දිස්ත්‍රික්කයේ භූ විෂමතාවය

ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාපයට අනුව කළුතර දිස්ත්‍රික්කය වෙරළබඩ තැනිතලාව හා අඩ තැනි කලාපවලට අයත් වන අතර, බුළුනොට- රක්වාන කඳු කලාපය ඉතා සුළු කොටසක් අයත් වේ. සමස්ථ දිස්ත්‍රික්කය භූ විෂමතා කලාප හතරකට බෙදා දැක්විය හැකිය. එනම් වෙරළබඩ තැනිතලා කලාපය, රළු බිම් සහිත අඩතැනි කලාපය, උස් රළුබිම් හා නිමන සහිත කලාපය හා, සමාන්තර මිටි කඳු වැටි නිමන සහිත උස් බිම් කලාපය වශයෙනි.

වෙරළබඩ තැනිතලා කලාපය (වෙරළබඩ නීරයේ සිට මීටර් 30 පමණ වන ප්‍රදේශ)

කළුතර දිස්ත්‍රික්කයේ වෙරළබඩ තැනිතලාවට අයත් ප්‍රදේශ ලෙස පානදුර, බේරුවල කොටියාස දැක්විය හැක. මෙයට අයත් වෙරළ නීරය කි.මී 36 දුරක් පමණ දිගින් යුක්ත වේ. කුඩා කලපු හා දෝනි (කළුතර කලපුව), වැලි වැටි (බෙන්තොට, කළුතර), බොකු (බේරුවල), තුඩු (මග්ගොන), දුපත් (ප්‍රදීපාගාරය පිහිටි බේරුවල බාබේරියන් දුපත) ආදී වෙරළබඩ භූ රූප ලක්ෂණයන් ගෙන් මෙම කලාපය සමන්විතයි. මීට අමතරව වෙරළාසන්න වැලි තැන්පතු, ගංගා හා ජල මාර්ග සම්බන්ධ පිටාර ගැලීම්, දියලුවෙන් පිරුණු ගිලීගිය නිමන සහිත තැනි බිම් මෙම කලාපයේ කැපී පෙනේ. කි.මී 1 ක් පමණ දුරකට විහිදෙන වෙරළබඩ නීරයේ ප්‍රධාන වශයෙන් පොල් වගාව සිදු කෙරේ.

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

ධීවර කර්මාන්තයත් වාණිජ මධ්‍යස්ථාන ලෙස ප්‍රධාන නගරත් පිහිටා ඇත්තේ මෙම කලාපයේය. මෙම කලාපයට අයත් පිටාර තැනි පහත්බිම් හා පුළුල් නිම්න ආශ්‍රිතව ඒ වගාවන්, තරමක් දුරට කොරටු වගාවන් දැකිය හැකිය.

වසරකට තුන්වරක් අස්වනු නෙලිය හැකිවී වගා කළ හැකි හැල් කුඹුරු අතීතයේ සිටම මේ කලාපයේ ප්‍රචලිතයි. බෙන්තර ගඟට උතුරින්ද බොල්ගොඩ ගඟ හා වැව් ආශ්‍රිතව ද පුළුල් වී වගා බිම් පැතිරී තිබේ.

වෙරළ තීරයේ ස්වභාවය අනුව පානදුර සිට පයාගල දක්වා දක්නට ලැබෙන්නේ තරමක් එකාකාරී ලෙස පැතිරුනු වෙරළ තීරයකි. නමුත් පයාගල සිට බෙන්තොට මෝය දක්වා කඩතොලු සහිත සංකීර්ණ වෙරළබඩ ලක්ෂණ දැකිය හැකිය. කළුතර දිස්ත්‍රික්කයට අයත් වෙරළ තීරය ආශ්‍රිත සුවිශේෂ ස්ථාන කිහිපයක් වේ. බේරුවල පිහිටි ස්වභාවික වරාය හා ඊට නුදුරින් බාබේරියන් දූපතේ පිහිටි අඩි 163 පමණ උස ප්‍රදීපාගාරය මෙහිදී ප්‍රධාන වේ. තවද බේරුවල වෙරළ තීරයේ ඉතා වටිනා බණිජ වැලි (මොනසයිට්) නිදන්ගතවී ඇත. තවද සුවිශේෂී ස්ථානයක් මග්ගොන වෙරළේ දැකිය හැකිය. ප්‍රදේශවාසීන් විසින් ගිංගම් ගුලිය වශයෙන් හඳුන්වන එම ස්ථානයේ මුහුදු රළ ගල් පර්වත මැදින් ඉහළට එසවී වේගයෙන් ගල් පර්වතයෙ වැදී එක් ස්ථානයක දී වේගයෙන් ආපසු ජල කඳ ගිලා බසී. මෙය බැලූ බැල්මට උමඟකින් ජලය ඇතුළට ගලායාමක් ලෙස පෙනේ. එය දිය සුළියක් වශයෙන් පෙනෙන නිසා ගිංගම් ගුලිය වශයෙන් ව්‍යවහාරයේ එයි. වෙරළබල භූ ලක්ෂණයක් වන මුහුදු ගුහා නිර්මාණ ක්‍රියාවලියේ එක් අවස්ථාවක් ලෙස මෙය හැඳින්වේ.

මෙයට අමතරව කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන ගංගා ත්‍රිත්ව මුහුදට වැටෙන ස්ථානවල සුවිශේෂ භූගෝලීය ලක්ෂණ දැකිය හැකිය. එක් වරම ගංගා මුහුදට එක් නොවී වැලි වැටි හෝ කුඩා බිම් තීරු බාධකයක් වශයෙන් තබා මද දුරක් වෙරළේ සමාන්තරව ගලා ගොස් මුහුදට එක්වීමෙන් ඒ තුළින් වැලි වැටි හා කලපු නිර්මාණය වී තිබීමත්, විශේෂයෙන් හඳුනාගත හැකියි.

වෙරළබඩ තැනිතලා කලාපය (මීටර 30-60) අතර

මද රැළි බිම් සහිත අඩ තැනි ලක්ෂණ වලින් සමන්විත මෙම කලාපයේ ද පුළුල් ව්‍යාප්තියක් දිස්ත්‍රික්කයෙ උතුරු කොටස් දැකිය හැක. තැන් තැන්වල විහිදුනු කුඩා කඳු ගැට කලාපය තුළ කැපී පෙනේ. බණ්ඩාරගම, හොරණ, දොඩන්ගොඩ, හා මදුරාවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල වැඩි භූමි ප්‍රමාණයක් අයත් වන්නේ මෙම කලාපයටයි. එහි භූවිෂමතාවය හා පස රබර් පොල් සහ වී වගාව සඳහා වඩාත් යෝග්‍යයි. තැනිබිම් හා ගෙවතු ආශ්‍රිතව රබර් වගාවන් මදක් පුළුල් ලෙස ව්‍යාප්ත වූ පහත් නිම්න වල වී වගාවන් ව්‍යාප්ත වී තිබේ. කළු ගංගාවට අවසන් වශයෙන් අතු ගංගා බොහොමයක් එකතු වන්නේ මේ කලාපයේදීය.

වෙරළබඩ තැනිතලා කලාපය (මීටර 60-200 ත් අතර)

කළුතර දිස්ත්‍රික්කයේ තුන්වන භූ විෂමතා කලාපය වන්නේ මීටර් 60 ත් මීටර් 200 ත් පමණ විහිදෙන උස් රැළි බිම් මිටි කඳු හා නිම්න වලින් සමන්විත උස් භූමි ප්‍රදේශයයි. මඳ වශයෙන් බෑවුම් සහිත කඳු හා නිම්න මෙම කලාපයේ කැපී පෙනේ. උස් වූ රැළි සහිති භූවිෂමතාවන් සහිත මෙම කලාපය මතුගම, වලල්ලාවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වලින් වැඩ ප්‍රමාණයකුත් බුලත්සිංහල හා අගලවත් කොට්ඨාසවල බටහිර කොටසත් අයත්ය. භූවිෂමතා කලාපයක් ලෙස සිවිවන කලාපය හැඳින්විය හැකිය.

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

වෙරළබඩ තැනිතලා කලාපය (මීටර 200-400 ත් අතර)

කළුතර දිස්ත්‍රික්කය තුළ ඉතා අඩු ප්‍රදේශයක් පුරා විහිදුණුදිස්ත්‍රික්කයේ ගිණිකොන දිග ප්‍රදේශයේ මෙම කලාපයට අයත් භූ විෂමතා ලක්ෂණ හඳුනාගත හැකිය. අගලවත්ත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වැඩි ප්‍රමාණයක් හා බුලත්සිංහල කොට්ඨාසයේ නැගෙනහිර අර්ධයත් මෙම කලාපයට අයත් වේ.සබරගමු කුඳුවැටිය බටහිර සීමාව සටහන් මෙම කඳු පන්තියේ උන්නතාංශය මීටර් 200- 400 අතර විහිදේ. මෙම කලාපයේ සංකීර්ණ කඳු හා නිම්න, සමාන්තරව විහිදුනු මිටි කඳු පන්ති හා ගැඹුරු නිම්න කැපී පෙනේ. විශේෂයෙන්ම මෙම කඳු වැටි වයඹ, ගිණිකොන දිශානුගතව සමාන්තරව විහිදී තිබීමත් ඒවා ඔස්සේ අයතගාමී හා තිර්යක් නිම්න බහුලව දක්නට ලැබීම විශේෂ ලක්ෂණයකි. ජලාකාර ජලවහන රටාවක් නිර්මාණය වීමට මෙම පසුබිම හේතු වී තිබේ. මෙම කලාපය තුළ බහුල වශයෙන් රබර් හා තේ වගාව සිදු කෙරේ. කලාපයෙන් සැලකිය යුතු භූමි ප්‍රමාණයක් අයත් වන්නේ මෙම කලාපයටයි. සවදගල, කළුගල, හුණුමුල්ල, යක්පිටිය, යගිරල, උඩුගම, කුරුපිට, ආදී වනාන්තර ප්‍රදේශ හා කඳුකර බිම් මෙම කලාපයේ කැපී පෙනේ. කළුතර දිස්ත්‍රික්කයේ සෙසු කලාප වලට සාපේක්ෂව මෙම කලාපයේ අඩු ජන ඝනත්වයක් හා අඩු යටිතල පහසුකම් ව්‍යාප්තියක් දක්නට ලැබේ.

කළුතර දිස්ත්‍රික්කයේ දේශගුණය

වසරේ වැඩි කාලයක් සෞම්‍ය දේශගුණයක් සහිත දිස්ත්‍රික්ක අතුරින් කළුතරට ලැබෙන්නේ ප්‍රධාන ස්ථානයකි. අතීතයේ පටන් කළුතර වාසභූමි කරගත් යුරෝපා ජාතිහු එහිසුවදායි පරිසරය වර්ණා කර තිබේ. ඔවුන්ගේ වාසය සඳහා කළු ගහ අසබඩ තේක්ක බංගලාව, රිව්මන්ඩ කාසල් මන්දිරය ඉදිවුයේ ප්‍රදේශයට එතරම්ම ඇළුම් කල නිසාවෙනි. ජලසම්පතින් ආඩ්‍ය වූ ද විවිධ මල්, පළතුරු, ශාක හා සතුන්ගේ පිරුණු සෙහාදහමේ අපූරු දායාදයන් සහිත ප්‍රදේශයක් ලෙස ජනප්‍රිය වීමට එහි පවත්නා දේශගුණය හේතු වී තිබේ.

කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන කාලගුණ නිරීක්ෂණ මධ්‍යස්ථානය කොළඹ වුව ද අනුබද්ධ උප නිරීක්ෂණ මධ්‍යස්ථාන කීපයකින් ද සමන්විතයි. කළුතර දිස්ත්‍රික්කයේ වර්ෂාපතන රටාව මූලික වශයෙන් තීරණය වන්නේ මෝසම් සුළං හා සංවහන ක්‍රියාවලිය මඟින්ත ඇතැම් කාලවල දී පීඩන අවපාත හා වාසුළි මඟින් වර්ෂාපන රටාවේ වෙනස්කම් ඇති කරයි. ප්‍රධාන වශයෙන් වර්ෂාපතන කලාප තුනකට කළුතර දිස්ත්‍රික්කය අයත් වේ. එනම් මි.මී 4000-5000, මි.මී 2500-3000 හා මි.මී 2500 අඩු වර්ෂාපතනයක් වශයෙනි.

දිස්ත්‍රික්කයේ වාර්ෂික වර්ෂාපතනය මි.මී 2900 ක් පමණ සාමාන්‍ය අගයක් ගනී. වර්ෂාපතනය ලැබෙන කාලවකවානු සලකන විට සැප්තැම්බර්, ඔක්තෝම්බර් හා නොවැම්බර් මාසවල ඉහළ වර්ෂාපතනයක් දැකිය හැකිය.

කළුතර දිස්ත්‍රික්කයේ පස

කළුතර දිස්ත්‍රික්කය ප්‍රධාන වශයෙන කෘෂි භෝග වගාවන්ට සුදුසු ප්‍රධාන පස් වර්ග තුනකින් සමන්විතය.

- අඩි 50-100 තරමක් වගුරු සහිත බිම්- කළු ගහ හා බෙන්තර ගහ යාබද ඇති කඩොලාන මඩ සහ තරමක් මඩ සහිත කළු පස,
- අඩි 100- 500 කළු ගහ හා එහි අතු ගංහා ආශ්‍රිත වියළි පස - දුඹුරු සාරවත් පස
- අඩි 500- 1000 - බිම් රතු කහ ෂෙඩ් ෂොලික් පසකින්ද යුක්තය.

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

කළුතර දිස්ත්‍රික්කයේ භූ සම්පත්

ප්‍රධාන භූ සම්පත් වශයෙන්,

- මිනිරන් - අගලවත්ත, නැබඩ, මතුගම
- පිහන් මැටි - දෙදියවල, යාල, ගලපාත
- මෙනොසයිට් - බෙරුවල, මතුගම, ප්‍රදේශවල බහුලව පිහිටා ඇත.
- මැණික් - බුලන්සිංහ, මතුගම ප්‍රදේශවල බහුල්ව පිහිටා ඇත.

කළුතර දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම

බුදුසිරිපා පහස ලත් සමනල ගිර මුදුනින් පැන නැග කඳු, ගිරි, හෙල් , දුර්ග අතුරින් ගලා බසින කළු නදියේ කෙළි බිම වූ කළුතර දිස්ත්‍රික්කය කෝරළ දෙකකින් (රයිගම් හා පස්දුන්), පත්තු අටකින් (කුඹුක, උඩු ගහ, මුංවත්තබාගේ, අධිකාරී, ඉද්දාගොඩ,වලල්ලාවිට, ගහබඩ හා මහපත්තුව)

තොටමුණ දෙකකින් (පානදුර හා කළුතර) සමන්විත වන අතර, ඉන් පානදුර තොටමුණ හා කුඹුක පත්තුවට හැර අන් සෑම පත්තුවක්ම, කෝරළයක්ම හා තොටමුණක්ම ඇතුළත්ව මුළු බිමෙන් 2/3 කට කළුනදියේ පහස ලැබීමේ සුවිශේෂ වරම හිමිව ඇත.

බිබිළ දොඩම්, බටලීය කජු, මල්වානේ පැණි රබුටන් , නාවල අන්නාසි සේම කළුතර මැංගුස්වලට ද හිමිව ඇත්තේ සුප්‍රසිද්ධ ස්ථානයකි. ඉතිහාසඥයින්ගේ පිළිගැනීම් හා ලැබී ඇති මානව ශිෂ්ඨාචාරයේ සාධක වලට අනුව ලෝකයේ පැරණිම ජනවාස අතරට කළුතර දිස්ත්‍රික්කය ද නැකම් කියන බව මේ වනවිට සනාථ වී ඇත. බුලන්සිංහල පාහියංගල ලෙන් ආශ්‍රිත කැනීම් වල දී කැනීම් වලට අනුව වසර විසිදාහකටත් ඇත යුගයේ එම ප්‍රදේශවල ජනවාස පැවති බව හෙළි වී ඇත.

බුදුසසුන පිහිට වූ දෙවන පෑතිස් රජසමයේ අනුරපුර ජයසුමන බෝසම්දුන්ගෙන් පැන නැඟී අෂ්ඨවල බෝධින්වහන්සේ ගෙන් පැවත එන දෙතිස් මහා ඵල රුක් බෝධින්වහන්සේලාගෙන් කළුතර බෝධින් වහන්සේ ද එකකි. පස්වන සියවසට අයත් යැයි සැලකෙන කළුතර දියගමින් හමු වූ "සෙල්ලිපියේ කණක මහ විහර " යන නම කළුතර පුරාණ විහාරයට භාවිතා කළ බැවි පැවසේ. තවද පස්වන සියවසහි ලංකාවට වැඩම කළ චීන ජාතික ධර්මාරාධක පාහියන් භික්ෂූන් වහන්සේ පාහියංගලට වැඩි බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

ක්‍රිස්තුවර්ෂ 11 වන සියවසේ රෝහණ (රුහුණු) පාලක වික්‍රමපාන්ඩ්‍යන්ගේ අගනුවර ලෙස සඳහන් වන "කාලනිත්ථ" අද කළුතර විය. ක්‍රිස්තුවර්ෂ 13 වන යුගයේ විසූ දෙවැනි පැරකුම් හා රජතුමා, දේවප්‍රතිරාජ ඇමති ලවා කළුතර මංමාවත් , පාලම් ද, පොල් උයනක්ද තැනූ බව චූලවංශ පවසයි.පොකුණුවිට රජමහා විහාරය, විදාගම වෙහෙර, නැබඩ ගඟේ උඩ විහාරය යන පැරණි විහාරස්ථානය හමු වී ඇති නටඹුන් වලින් කළුතර දිස්ත්‍රික්කය අනුරපුර යුගයේ සිටම වැදගත් වූ බව සඳහන් කළ හැකිය.

කෝට්ටේ යුගයේ ද වැදගත් තැන් කළුතරට හිමි විය. කෝට්ටේ යුගයේ රචිත ගිරා, පරවි, හංස සංදේශ කාව්‍යවල කළුතොට ඇතුළු ප්‍රදේශ ගණනාවක නම් සහ වර්ණනා ඇතුළත්ව ඇත.

විශේෂයෙන් පෘතුගීසීන් මුහුදුබඩ අනසක පැතිරීමට පටන් ගත් අවධියේ සිටම මෙය ඔවුන්ගේ වාණිජ මධ්‍යස්ථානයක් වූ අතර, බලකොටුවක් ද පිහිටු විය. ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගත් පසු ආර්ථික කටයුතු වලදී ප්‍රමුඛස්ථානයක් කළුතරට හිමි වී ඇත. එහි වැදගත්කම කොතරම් වී ද යත් කොළඹ සිට බොල්ගොඩ හරහා කළුතර ඇළ මෝදර හරහා තැනූ ඇළ ඔස්සේ කළුගහට සම්බන්ධ

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

ඇළ මාර්ගය රත්නපුර ප්‍රදේශයේ සිට විවිධ නිෂ්පාදන ප්‍රවාහනයට යොදා තිබිනි. ඒ අවධියේම පානදුර සිට නම්බපාන මහා මාර්ගය අගුරුවාතොට මහා මාර්ගය ද, නැබඩ පාලම ද ඉදි වූ බව පැවසේ.

ඉංග්‍රීසි පාලන සමයේදී මෙම මාර්ග වලට පෙරටත් වඩා වැඩි වැදගත්කමක් ලැබුණි. නිෂ්පාදන ප්‍රවාහනට කැපූ ඇළ ඔස්සේ නැබඩ දක්වා කුඩා රුවල් නැව් පවා යාත්‍රා කළ බව දැක්වේ. වර්තමානයේ මෙම ඇළ මාර්ග අභාවට ගොස් ඇති අතර, ඉඳහිට ලී පහුරු මහින් මොරටුව දක්වා දැව ප්‍රවාහනයට යොදා ගනී. යටත් විජිත සමයේදී 1873 දී පැවති වාදයේදී, ඇති වූ අධ්‍යාපන ප්‍රබෝධය ක්‍රමයෙන් දිස්ත්‍රික්කය පුරා වේගයෙන් පැතිරුණි. එම යුගයේ සිටම අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් තැනක් ද, කළුතරට හිමිව තිබුණ නිසා ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජ හා දේශපාලන කටයුතු වල දී ප්‍රමුඛස්ථානයක් ලබාගෙන කටයුතු කිරීමට කළුතර ජනතාවට හැකි විය.

වැවිලි ආර්ථිකය ඇරඹීමෙන් පසුව කළුතර දිස්ත්‍රික්කයට කොතරම් යුරෝපියන් අතර ප්‍රසිද්ධ විද යන් කොළඹ කාර්ය බහුල ජීවිත ගතකරන විදේශකයින්ගේ විවේක ස්ථානය වූයේ සනිපවන් කළුතර ප්‍රදේශයයි. එවකට තෙබුවන වැවිලිකරුවන්ගේ විවිධ තරග පවත්වන ජනප්‍රිය ක්‍රීඩා පිටියකි.

ඕලන්ද සමයේ සිට රා අරක්කු නිෂ්පාදනයේ ප්‍රමුඛ තැන කළුතරට ලැබී තිබින. පළමු ලෝක යුධ සමය වන විට රබර් වගාව ව්‍යාප්ත වූ අතර වර්තමානයේ දිස්ත්‍රික්කයේ ප්‍රධාන ආර්ථික වගාව රබර් වී ඇත.

කළුතර දිස්ත්‍රික්කයේ භූ සම්පත්

ප්‍රධාන භූ සම්පත් වශයෙන්,

- මිනිරන් - අගලවත්ත, නැබඩ, මතුගම
- පිඟන් මැටි - දෙදියවල, යාල, ගලපාත
- මෙනොසයිට් - බේරුවල, මතුගම, ප්‍රදේශවල බහුලව පිහිටා ඇත.
- මැණික් - බුලන්සිංහ, මතුගම ප්‍රදේශවල බහුලව පිහිටා ඇත.

කළුතර දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම

බුදුසිරිපා පහස ලත් සමනල ගිර මුදුනින් පැන නැඟ කලු, ගිරි, හෙල් , දුර්ග අතුරින් ගලා බසින කළු නදියේ කෙළි බිම වූ කළුතර දිස්ත්‍රික්කය කෝරළ දෙකකින් (රයිගම් හා පස්දුන්), පත්තු අටකින් (කුඹුක, උඩු ගහ, මුංචිත්තබාගේ, අධිකාරී, ඉද්දාගොඩ,වලල්ලාවිට, ගහබඩ හා මහපත්තුව)

තොටමුණ දෙකකින් (පානදුර හා කළුතර) සමන්විත වන අතර, ඉන් පානදුර තොටමුණ හා කුඹුක පත්තුවට හැර අන් සෑම පත්තුවක්ම, කෝරළයක්ම හා තොටමුණක්ම ඇතුළත්ව මුළු බිමෙන් 2/3 කට කළුනදියේ පහස ලැබීමේ සුවිශේෂ වරම හිමිව ඇත.

බිබිළ දොඩම්, බටලීය කජු, මල්වානේ පැණි රඹුටන් , නාවල අන්නාසි සේම කළුතර මැංගුස්වලට ද හිමිව ඇත්තේ සුප්‍රසිද්ධ ස්ථානයකි. ඉතිහාසඥයින්ගේ පිළිගැනීම් හා ලැබී ඇති මානව ශිෂ්ඨාචාරයේ සාධක වලට අනුව ලෝකයේ පැරණිම ජනවාස අතරට කළුතර දිස්ත්‍රික්කය ද නැකම් කියන බව මෙ වනවිට සනාථ වී ඇත. බුලත්සිංහල පාඟියංගල ලෙන් ආශ්‍රිත කැනීම් වල දී කැනීම් වලට අනුව වසර විසිදාහකටත් ඇත යුගයේ එම ප්‍රදේශවල ජනවාස පැවති බව හෙළි වී ඇත.

බුදුසසුන පිහිට වූ දෙවන පැතිස් රජසමයේ අනුරපුර ජයසුමන බෝසමිදුන්ගෙන් පැන නැඟී අෂ්ඨවල බෝධින්වහන්සේ ගෙන් පැවත එන දෙතිස් මහා ඵල රුක් බෝධින්වහන්සේලාගෙන් කළුතර බෝධින් වහන්සේ ද එකකි. පස්වන සියවසට අයත් යැයි සැලකෙන කළුතර දියගමින් හමු වූ "සෙල්ලිපියේ

කණක මහ විහර " යන නම කළුතර පුරාණ විහාරයට භාවිතා කළ බැව් පැවසේ. තවද පස්වන සියවසහි ලංකාවට වැඩම කළ චීන ජාතික දේශාඨක පාහියන් භික්ෂූන් වහන්සේ පාහියංගලට වැඩි බව ජනප්‍රවාදයේ සඳහන් වේ.

ක්‍රිස්තුවර්ෂ 11 වන සියවසේ රෝහණ (රුහුණු) පාලක වික්‍රමපාන්ඩියන්ගේ අගනුවර ලෙස සඳහන් වන "කාලනිත්ථ" අද කළුතර විය. ක්‍රිස්තුවර්ෂ 13 වන යුගයේ විසූ දෙවැනි පැරකුම් හා රජතුමා, දේවප්‍රතිරාජ ඇමති ලවා කළුතර මංමාවත් , පාලම් ද, පොල් උයනක්ද තැනූ බව චූලවංශ පවසයි.පොකුණුවිට රජමහා විහාරය, විදාගම වෙහෙර, නැබඩ ගඟේ උඩ විහාරය යන පැරණි විහාරස්ථානය හමු වී ඇති නටඹුන් වලින් කළුතර දිස්ත්‍රික්කය අනුරපුර යුගයේ සිටම වැදගත් වූ බව සඳහන් කළ හැකිය.

කෝට්ටේ යුගයේ ද වැදගත් තැන් කළුතරට හිමි විය. කෝට්ටේ යුගයේ රචිත ගිරා, පරවි, හංස සංදේශ කාව්‍යවල කළුතොට ඇතුළු ප්‍රදේශ ගණනාවක නම් සහ වර්ණනා ඇතුළත්ව ඇත.

විශේෂයෙන් පෘතුගීසීන් මුහුදුබඩ අනසක පැතිරීමට පටන් ගත් අවධියේ සිටම මෙය ඔවුන්ගේ වාණිජ මධ්‍යස්ථානය වූ අතර, බලකොටුවක් ද පිහිටු විය. ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගත් පසු ආර්ථික කටයුතු වලදී ප්‍රමුඛස්ථානයක් කළුතරට හිමි වී ඇත. එහි වැදගත්කම කොතරම් වී ද යත් කොළඹ සිට

බොල්ගොඩ හරහා කළුතර ඇළ මෝදර හරහා තැනූ ඇළ ඔස්සේ කළුගහට සම්බන්ධ ඇළ මාර්ගය රත්නපුර ප්‍රදේශයේ සිට විවිධ නිෂ්පාදන ප්‍රවාහනයට යොදා තිබිනි. ඒ අවධියේම පානදුර සිට නම්බපාන මහා මාර්ගය අගුරුවාතොට මහා මාර්ගය ද, නැබඩ පාලම ද ඉදි වූ බව පැවසේ.

ඉංග්‍රීසි පාලන සමයේදී මෙම මාර්ග වලට පෙරටත් වඩා වැඩි වැදගත්කමක් ලැබුණි. නිෂ්පාදන ප්‍රවාහනට කැපූ ඇළ ඔස්සේ නැබඩ දක්වා කුඩා රුවල් නැව් පවා යාත්‍රා කළ බව දැක්වේ. වර්තමානයේ මෙම ඇළ මාර්ග අභාවට ගොස් ඇති අතර, ඉදහිට ලී පහුරු මහින් මොරටුව දක්වා දැව ප්‍රවාහනයට යොදා ගනී. යටත් විජිත සමයේදී 1873 දී පැවති වාදයේදී, ඇති වූ අධ්‍යාපන ප්‍රබෝධය ක්‍රමයෙන් දිස්ත්‍රික්කය පුරා වේගයෙන් පැතිරුණි. එම යුගයේ සිටම අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් තැනක් ද, කළුතරට හිමිව තිබුණ නිසා ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජ හා දේශපාලන කටයුතු වල දී ප්‍රමුඛස්ථානයක් ලබාගෙන කටයුතු කිරීමට කළුතර ජනතාවට හැකි විය.

වැවිලි ආර්ථිකය ඇරඹීමෙන් පසුව කළුතර දිස්ත්‍රික්කයට කොතරම් යුරෝපියන් අතර ප්‍රසිද්ධ වී ද යත් කොළඹ කර්යය බහුල ජීවිත ගතකරන විදේශකයින්ගේ විවේක ස්ථානය වුයේ සනිපවත් කළුතර ප්‍රදේශයයි. එවකට තෙබුවන වැවිලිකරුවන්ගේ විවිධ තරඟ පවත්වන ජනප්‍රිය ක්‍රීඩා පිටියකි.

ඕලන්ද සමයේ සිට රා අරක්කු නිෂ්පාදනයේ ප්‍රමුඛ තැන කළුතරට ලැබී තිබින. පළමු ලෝක යුධ සමය වන විට රබර් වගාව ව්‍යාප්ත වූ අතර වර්තමානයේ දිස්ත්‍රික්කයේ ප්‍රධාන ආර්ථික වගාව රබර් වී ඇත.

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

පරිපාලනය

කළුතර දිස්ත්‍රික්කයේ පරිපාලන ව්‍යුහය

වර්තමානයේ කළුතර දිස්ත්‍රික්කය නමින් හඳුන්වන පරිපාලන ඒකකය ඉංග්‍රීසීන් විසින් ක්‍රියාත්මක කරන ලද පරිපාලන ප්‍රතිසංස්කරණ වලින් පසුව බිහි වුවකි. ලංකාවේ ක්‍රියාත්මක වූ සම්ප්‍රදායික පරිපාලන ක්‍රමය යටතේ ශත වර්ෂ ගණනාවක්ම කළුතර දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශ හැඳින්වුයේ පස්යොදුන් රට, පස් යොදුන් කෝරළය ආදි වශයෙනි. මෙරට ප්‍රාදේශීය පරිපාලන ඒකක හැඳින්වීමට කෝරළය යන නම 16 වන සියවසට පෙර පවා භාවිතා වූ නමුත් කළුතර ප්‍රදේශය හැඳින්වීමට පස්යොදුන් කෝරළය යන භාවිතා වුයේ පෘතුගීසීන්ගේ පැමිණීමෙන් පසු කාලයේ දීය.

ශ්‍රී ලංකාව විදේශීය ආක්‍රමණවලට ගොදුරුව පැවති අවධියේ පෘතුගීසීන් විසින් ප්‍රාදේශීය පාලකයින් තමා වෙත නැඹුරු කර ගැනීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් 1597 වන විට කෝට්ටේ රාජධානිය මුළුමනින්ම යටත්කරගත් පෘතුගීසීන් සබරගමුන, සතර කෝරළය, සත් කෝරළය හා මාතර යනුවෙන් කොටස් 4 කට වෙන් කරන ලද්දේය. එකල කළුතර, කෝට්ටේ රාජධානියේ, පස්දුන්රට කෝරළයට අයත් විය. එවකට ප්‍රධානතම ප්‍රාදේශීය පාලකයා දිසාපති වශයෙන් හඳුන්වන ලද අතර, පෘතුගීසි පාලන සමයේ සිටි එකම සිංහල දිසාපති වූයේ දොන් ප්‍රනාන්දු සමරකෝන් මැතිතුමාය. ප්‍රාදේශීය පාලනයේ සියළුම බලතල දැරූ ඔහුට සහාය දීම සඳහා අදායම් පාලක නිලධාරීහු ද එම කොට්ඨාසය තුළ ගම් මට්ටමින් විදානෙවරුද රාජකාරි කළහ.

18 වන ශතවර්ෂයේ ලන්දේසි පාලනයට යටත්වූ පසුව මුහුදුබඩ ප්‍රදේශ ගාල්ල, කොළඹ, යාපනය වශයෙන් පාලන කොට්ඨාස 3 කට බෙදා වෙන්කරන ලදී. කොළඹ පරිපාලන කොට්ඨාශය බෙන්තර ගඟ සිට මහ ඔය දක්වා විහිදුනු විශාල ප්‍රදේශයකට සීමා වූ අතර කළුතර ද මීට ඇතුළත් විය.

1789 දී මුහුදු ප්‍රාදේශයද, 1815 උඩරට ප්‍රදේශයද, සිය පාලනයට නතුකර ගත් ඉංග්‍රීසීන් විසින්, ප්‍රාදේශීය පාලනය ක්‍රමවත් කිරීම පිණිස 1829 දී කෝල්බෘක් කොමිසම පත්කරන ලදී. රම කොමිසමේ යෝජනා පරිදි නැවත බෙදා වෙන් කරන ලද පරිපාලන කොට්ඨාශ අනුව ආණ්ඩුව මඟින් පාලනය වන පළාත් පාලන ආයතන පිහිටුවන ලදී.

1833 වසරේ දී බෙන්තර ගඟ සිට මහඔය දක්වා ප්‍රදේශය බස්නාහිර පළාත් නමින් පාලන කොට්ඨාශයක් බවට පත්විය.

1890 පමණ වන විට පළාත් ඒජන්ත වග කියන උප ඒජන්ත කොට්ඨාස ක්‍රියාත්මක විය. උප ඒජන්ත කෙට්ඨාස පාලනයට උප ඒජන්තවරයකු සිටින අතර, උප ඒජන්තවරයකු සිටින අතර උප ඒජන්තවරයාට සහාය දීමට මුදලිවරු ද, ඔවුන් යටතේ ගම් දහයකට එක් අයෙකු වශයෙන් විදානෙ ආරච්චිවරුද, ඔවුන් යටතේ ගම්මට්ටමින් පොලිස් මුලාදැනි තනතුරු ද ක්‍රියාත්මක විය. උසස්ම ප්‍රාදේශීය මුලාදැනි තනතුර වුයේ පත්තුවක් හෝ කෝරළයක් භාරව ක්‍රියාකළ මුදලිවරයාය.

දිස්ත්‍රික් ඒජන්තවරු විසින් ප්‍රදේශයේ උගත් ධනවත් පවුල්වලින් මුදලිවරු තෝරාගන්නා ලදී. එසේම මුදලිවරු විසින් එම ප්‍රදේශයේ යහපත් ආර්ථික හා සමාජ තත්වයක් ලබා ඇති ගම්වැසියන් අතරින් නායකත්වයට සුදුසු යැයි පිළිගන්නා වූ ප්‍රභූ පවුල්වලින් විදාන ආරච්චිවරු පත්කර ගන්නා ලදී. ඔවුන් මෙසේ ගොඩනඟා නිබුණු මෙම සමාජ තත්ත්වය නිසා එකල ග්‍රාමීය මට්ටමේ කෘෂිකර්මය නඟාසිටුවීමට මෙන්ම සාමකාමී පාලනයක් ගෙන යාමට මෙට මහෝපකාරී විය.

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

1931 දී ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් සමග පැන නැගුණු වෙනස්කම් අනුව 1938 දී ආදාම් පාලක කොට්ඨාස සමග පත්වී සිටි මුදලි තනතුරු අහෝසි වී ප්‍රථමවරට තරහ විභාගයකින් ආදායම් පාලක නිලධාරීන් පත් කෙරුණි.

1961 වසරේ ගම්මුලාදෑනි ක්‍රමය ද වෙනස් කරන ලදී. තරග විභාගයකින් තෝරාගන්නා ලද ග්‍රාම සේවක තනතුරු ඇති විය. මේ නිසා ආදායම් පාලක කොට්ඨාස සඳහා ආදායම් පාලක නිලධාරීන් ද, ගම් මට්ටමින් වසම් සඳහා ග්‍රාම සේවකවරු ද පත් විය. ඔවුන් දිස්ත්‍රික් දිසාපතිවරයාගේ දායකත්වය අවම විය. මේ බව එටාහගත් ඩොනමෝර් පාලකවරු දිසාපතිවරයා රජයේ සංවර්ධන වැඩකටයුතුවල දිස්ත්‍රික් සංවර්ධන නිලධාරියා වශයෙන් පත්කරන ලදී. මෙමඟින් විශේෂයෙන් ජනතාවට අවශ්‍ය කෘෂිකාර්මික සංවර්ධන කටයුතු වේගවත් කිරීම බලාපොරොත්තු විය.

ග්‍රාමීය ජනතාවගේ ප්‍රශ්න තේරුම්ගෙන කටයුතු කිරීමේ අවශ්‍යතාවය විශාල වශයෙන් පැන නැගුණි. එම නිසා පාලන තන්ත්‍රය ඒ සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් ප්‍රාදේශීය වශයෙන් පරිපාලනය විමධ්‍යගත කිරීමේ දෙවන පියවර වශයෙන් 1973 දී දිස්ත්‍රික් දේශපාලන අධිකාරි ක්‍රමය ස්ථාපිත කරන ලදී. දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීමේ කටයුතුවල දී ජනතා සහභාගීත්වය පුළුල් කිරීමට මෙමඟින් අපේක්ෂා කරන ලදී.

දේශපාලන අධිකාරියේ මූලස්ථානය කච්චේරිය වූ අතර එහි ලේකම් වශයෙන් දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨතරයා නිලබලයෙන් පත්වේ. අදායම්පාලක නිලධාරී, සහකාර ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ වශයෙන් නන්තුර පසුකාලීනයට වෙනස් විය. මෙම ක්‍රමය තුළ ද ග්‍රාමීය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් හිඟකම ප්‍රධාන ගැටළුවක් බවට පත්විය. මෙම තත්වය මහ හැරවීම පිණිස විමධ්‍යගත අයවැය ක්‍රමය හඳුන්වා දීම මඟින් දේශපාලන අධිකාරියේ බලය ශක්තිමත් කිරීමට හැකිවිය. කළුතර දිස්ත්‍රික්කයේ මැනිවරණ කොට්ඨාස මට්ටමින් වෙන්කර තිබූ විමධ්‍යගත අයවැය මුදල් සඳහා සංවර්ධන වැඩසටහන් සකස් කිරීමේ දී ප්‍රදේශීය උපදිසාපතිවරයා හා සමගාමීව කටයුතු කිරීමට දේශපාලකයින්ට මින් අවස්ථාව ලැබිණ.

කෙසේ වෙත් මේ වකවානුව වන විට කළුතර දිස්ත්‍රික් ප්‍රාදේශීය ආදායම් කෝට්ඨාස 11 ක් තිබුණි. එමෙන්ම කාර්යභාරය සලකා බලා පසුව මේවා උපදිසාපති කාර්යාල වශයෙන් නම් කරන ලදී.

1978 වසර වන විට එවකට පැවති රජය විසින් දේශපාලන අධිකාරිය, දිස්ත්‍රික් අමාත්‍ය ක්‍රමය යනුවෙන් වෙනස් කරන ලදී. ඔහුගේ දිසාලේකම් වශයෙන් දිසාපතිවරයා නිලබලයෙන් පත් වූ අතර,මෙමඟින් සංවර්ධන කාර්යයන් පිළිබඳ තීරණ ගැනීමේ දී පවත්නා වූ පරිපාලන රටාව වඩාත් නම්‍යශීලී කොට සුමට මගකට යොමු කිරීම මෙමඟින් බලාපොරොත්තු විය. මෙම ක්‍රමය තුළින් සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම මෙන්ම ක්‍රියාත්මක කිරීමට සිදුකරන ලදී.

1981 වන විට එවකට පැවති රජය දිස්ත්‍රික් සංවර්ධන සභාක්‍රමය හඳුන්වා දෙන ලදී. කළුතර දිස්ත්‍රික්කයේ ආසන 8 ක් සඳහා නියෝජිතයන් තෝරා පත් විය. ඔවුන්ගෙන් සෑදුම් ලත් සංවර්ධන සභාව සඳහා සභාපති ඔවුන්ගේ මනාපය හා දේශපාලන බලය මත පත්කරන ගන්නා ලදී.

සෑම ග්‍රාම නිලධාරී වශයෙන් සඳහාම එක් මණ්ඩලයක් බැගින් ග්‍රාමෝදය මණ්ඩලයක් පිහිටුවන ලදී. සෑම උපදිසාපති කොට්ඨාසයක් සඳහාම ප්‍රාදේශීය මණ්ඩල ස්ථාපනය කරන ලදී.මෙලෙස පිහිටුවන සංවර්ධන සභාක්‍රමය තුළ ද සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී දිසා ඇමතිවරයා හා දිස්ත්‍රික් සංවර්ධන සභා අතර පැවතියේ දුර්වල සම්බන්ධතාවයකි.

1987 වන විට ප්‍රාදේශීය පරිපාලනය විමධ්‍යගත කිරීමේ නවතම ඉදිරි පියවර වූ පළාත් සභා ක්‍රමය 1987 පළාත් සභා පනත මඟින් එළිදැක්විණ. මෙමඟින් මධ්‍යම රජයේ බලතල ප්‍රාදේශීය මට්ටමින්


වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

මුදා හැරීමට ශක්තිමත් අඩිතාලමක් වූ අතර, අද දක්වා මෙම ක්‍රමය ක්‍රියාත්මක වේ. මේ යටතේ පිහිට වූ බස්නාහිර පළාත්සභාව ප්‍රධාන අමාත්‍ය හා ඇමති මණ්ඩලයකින් සමන්විතයි. පළාත්සභාව සඳහා 1987 කළුතර දිස්ත්‍රික්කයෙන් නියෝජිතයින් 22 ක් මහජන ඡන්දයෙන් තෝරා පත්කර ගන්නා ලදී. 1992 වන විට දිස්ත්‍රික්කයේ පරිපාලන ව්‍යුහයේ වෙනසක් දක්නට ලැබුණි. කච්චේරි ක්‍රමය අහෝසි වී කච්චේරිය දිසාලේකම් කොට්ඨාස යනුවෙන් හඳුන්වන ලද අතර, උප දිසාපති තනතුර ප්‍රාදේශීය ලේකම් තනතුර බවට පරිවර්තනය විය. එසේම ග්‍රාම සේවක තනතුර ග්‍රාම නිළධාරී තනතුර බවට වෙනස් විය. ග්‍රාමෝදය මණ්ඩල අහෝසි වී මහජන ඡන්දයෙන් පත්කල නියෝජිතයන්ගෙන් සැදුමලන් ප්‍රාදේශීය සභා පිහිටුවන ලදී.

අද දක්වා ක්‍රියාත්මක වන පළාත් සභා ක්‍රමය තුළ ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, පළාත් සභා හා සම්බන්ධීකරණය පරිපාලන ඒකකයක් බවට පත්වී ඇත. වර්තමානයේ මධ්‍යම රජය හා පළාත් සභාවට සම්බන්ධ මහජනතාවගේ අවශ්‍යතාවයන් ඉටුකිරීමට ප්‍රාථමික හා වැදගත් පරිපාලන ඒකකය බවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පරිවර්තනය වී ඇත.

ඒ අනුව කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක් ඇත.

- පානදුර
- බණ්ඩාරගම
- හොරණ
- ඉංගිරිය
- බුලත්සිංහල
- මධුරාවල
- මිල්ලනිය
- කළුතර
- බේරුවල
- දොඩංගොඩ
- මතුගම
- අගලවත්ත
- පාලින්දනුවර
- වලල්ලාවිට



1.2කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම හා මෙහෙවර

අපගේ දැක්ම

කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවය තුලින් විශිෂ්ටත්වයක් කරා

අපගේ මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ඵලදායී සම්පත් කලමණාකරනයක් තුලි
කාර්යක්ෂම පරිපාලන ව්‍යුහයක් බිහිකර දිස්ත්‍රික්කයේ
නිරසාර සංවර්ධනයක් ඇති කිරීම
අප මෙහෙවරයි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු හා අගයන්

➢ කාලානුරූපව රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව නිරසාර සංවර්ධන පිළිවෙතක් සඳහා පෙළ ගැසීම.

➢ මහජන අවශ්‍යතාවයන් සපුරාලීමට නිරන්තර විශ්වසනීයත්වයෙන් කාර්යක්ෂමව පෙළ ගැසීම.

➢ දිස්ත්‍රික්කයතුලආර්ථික,සාමාජීය,ආගමික,සංස්කෘතික,අධ්‍යාපනික සංවර්ධන ක්‍රියාදාමයටජනතා විභේදනයකින් තොරව ක්‍රියා කිරීම.

අගයන්

➢ සෑම විටම අපගේ භාෂණයට ගැලපෙන නිශ්චිත ක්‍රියාකාරවිම් තුලින් විශ්වසනියත්වයආරක්ෂා කිරීම.

➢ අභ්‍යන්තර හා බාහිර පාරිභෝගිකයෙකුට අදාළව ගනු ලබන සෑම තීරණයකදීම ඔහුවෙත උපරිම අයුරින් ගරුත්වයක් ලැබෙන පරිදි කටයුතු කිරීම


1.3. ප්‍රධාන කාර්යයන්

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පරිපාලනමය කටයුතු හා අධීක්ෂණ කටයුතු
- සමාජ සේවා කටයුතු
- සංස්කෘතික හා බෞද්ධ කටයුතු
- දිස්ත්‍රික් සංවර්ධන කටයුතු,ඉදි කිරීම් හා නඩත්තු කටයුතු
- දැව බලපත්‍ර හා අනෙකුත් බලපත්‍ර කටයුතු
- දිස්ත්‍රික් පරිසර සංවර්ධන කටයුතු
- කෘෂිකර්ම සංවර්ධන කටයුතු
- මිල නියම කිරීමේ කමිටුව හා සම්බන්ධ කටයුතු
- මැනිවරණ සම්බන්ධ කටයුතු
- මානව සම්පත් සංවර්ධනය හා ඵලදායිතාව නංවාලීමේ පුහුණු කටයුතු
- ග්‍රාම නිලධාරීන්ගේ පරිපාලන කටයුතු
- උප්පැන්න,මරණ,විවාහ රෙජිස්ට්‍රාර්වරුන් හා හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කිරීම පිළිබඳ කටයුතු
- ජුරි සභික නාම ලේඛණය සකස්කර අධිකරණයට ඉදිරිපත් කිරීම
- ජාතික උත්සව සහ විවිධ සුභ සාධන කටයුතු කිරීම
- මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු
- අවශ්‍ය අවස්ථාවලදි රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන්ගේ සහයෝගය දිස්ත්‍රික්කයේ ජනතාවට ලබාදීම
- හදිසි ආපදා සහන සේවා හා ප්‍රතිසංස්කරණය කිරීම
- දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව පත් කිරීම
- සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම
- විනය පරීක්ෂණ කටයුතු

වාරෂික කාර්යසාධන වාර්තාව - 2024

සංවිධාන සටහන

1.4.සංවිධාන සටහන



ස.දි.ලේ	- සහකාර දිස්ත්‍රික් ලේකම්	බබෙ.ස	- බෙදද්ධ කටයුතු සමාරෝජක	කළ.ස	- කළමනාකාරණ සහකාර	කා.නි	- කාර්මික නිලධාරි
ස.අ.කුඩා	- සහකාර අධ්‍යක්ෂ කුඩා වාාපාර	ශ්.කා.නි.කි.මිළඟම්	- ශ්‍රාවන කාර නිලධාරි කිරුළි මිළඟම්	සං.නි	- සංවර්ධන නිලධාරි	කා.ස	- කාර්මික සහකාර
ජේ. සං.ලේඛනාදූ	- සංඛ්‍යා ලේඛනාදූ	ස.ශස්.නි	- දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරි	ජන.ස.නි	- ජනජන සම්බන්ධතා නිලධාරි	සැ.සි	- සැලසුම් ශිල්පි
ස.සුසුරණ.උ.වා	- සහකාර සුසුරණ උවිත පාලක	පරී.නි	- පරිපාලන නිලධාරි	ඒම.නි	- ඒමර්ශන නිලධාරි	ග.සා	- ගබඩා සාරකරු
ස.අ.සංස්.	- සහකාර අධ්‍යක්ෂ සංස්කෘතික	ප්‍ර.කළ.ස	- ප්‍රධාන කළමනාකාරණ සහකාර	සං.නි.(සුසුඳු)	- සංවර්ධන නිලධාරි (සුසුඳු)	අ.නි	- අභ්‍යන්තර විගණාය නිලධාරි
කෘ.අධ්‍යක්ෂ	- කෘෂිකාර්ම අධ්‍යක්ෂ	ප්‍ර.ශ්‍රි.ස	- ප්‍රධාන ශ්‍රීදල් සහකාර	කතා.කා.ස	- කතෝතුරු කාර්යාලය සහ සන්නිවේදන සහකාර		
ස.සමෘ.අකා.	- සහකාර සමෘද්ධි කොමිසාරිස්	සං.ස	- සංවර්ධන සහකාර	සං.සම	- සංවර්ධන සම්බන්ධීකාරක		

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවතින ප්‍රධාන අංශ

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ

- පාලන අංශය
- ගිණුම් අංශය
- දිස්ත්‍රික් ක්‍රමසම්පාදන කාර්යාලය
- සංවර්ධන අංශය
- ඉඩම් අංශය
- ඉංජිනේරු අංශය
- සමාජ සේවා අංශය
- පුනුණු අංශය
- පුපුරණ ද්‍රව්‍ය ඒකකය
- මාධ්‍ය ඒකකය
- ආපදා සහන සේවා අංශය
- විමර්ශන අංශය
- ළමා හා කාන්තා කටයුතු අංශය
- E- ග්‍රාමනිලධාරි ඒකකය
- රාජ්‍ය නොවන සංවිධාන අංශය
- බෞද්ධ කටයුතු අංශය
- බහුකාර්යය සංවර්ධන අංශය

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල

- පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- මධුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- බෙරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි ඉලක්ක

2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉලක්ක

විශේෂ ජයග්‍රහණ

- මානව සම්පත් සංවර්ධන අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ අරමුණු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් බහුතරයකට විවිධ පුහුණු අවස්ථා ලබා දීමට හැකි වීම.
- නව රජයේ වැඩපිළිවෙළක් යටතේ හඳුන්වා දුන් "Clean Sri Lanka" ව්‍යාපෘතිය කළුතර දිස්ත්‍රික්කය තුළ සාර්ථකව ක්‍රියාත්මක කිරීම.

අභියෝග

- ජනතාවට මුහුණ දීමට සිදු වූ ආර්ථික අභියෝග හමුවේ වුව ද ඔවුන් වෙනුවෙන් මහජන සේවාවන් කාර්යක්ෂම හා ඵලදායීව පවත්වා ගෙන යාමට දිස්ත්‍රික්කය පුරා කාර්යය මණ්ඩලය සාර්ථකව මෙහෙය වීමට කටයුතු කිරීම.
- අස්වැසුම ප්‍රතිලාභ වැඩසටහන දෙවන අදියර ක්‍රියාත්මක කිරීමේ දී උද්ගත වූ නොයෙකුත් ගැටළුවලට සාර්ථකව හා ඵලදායී විසඳුම් සහ ගැටළු නිරාකරණයට සෘජුව මැදිහත් වීමට සිදු වීම.
- තාක්ෂණ පහසුකම්වල අඩුපාඩු, කාර්යය මණ්ඩලයේ දැනුම අවබෝධය සහ ආකල්පමය දුර්වලතා හඳුනා ගනිමින් අවශ්‍ය පියවර යෙදීම.

ඉදිරි ඉලක්ක

- දිස්ත්‍රික්කය තුළ දරිද්‍රතාවයෙන් පීඩා විඳින ජනතාව වටා උද්ගත වී තිබෙන ගැටළු හා බාධක අරමුණු කරගත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම.
- ආර්ථික අර්බුදය හමුවේ ජීවන මාර්ග බිඳවැටී තිබෙන ජනතාවගේ ආර්ථිකය නහා සිටුවීම සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් දියත් කිරීම තුළින් තිරසාර සංවර්ධන ඉලක්ක ජය ගැනීම.
- පුහුණු හා සංවර්ධන අවශ්‍යතා සාර්ථක කර ගැනීම පිණිස මානව සම්පත් සංවර්ධන සැලැස්මට අනුගතව කටයුතු කර ගනිමින් සේවාලාභී සත්කාරය උපරිම මට්ටමකට ගෙන ඒම සඳහා කාර්යය මණ්ඩලය සාර්ථකව මෙහෙයවීම.

ජී.ඩබ්.ජනක කේ.ගුණවර්ධන
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
කළුතර පරිපාලන දිස්ත්‍රික්කය

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

03 පරිච්ඡේදය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

එෆ්ඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයසඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තත්‍ය 2024 රු.	2,023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	එෆ්ඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවාමත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මතබදු	3	-	-	
-	බදු නොවන ආදායම්හාවෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		6,888,599,000	4,280,195,130	එෆ්ඒ-3
-	තැන්පතු		2,086,388,087	1,990,633,883	එෆ්ඒ-4
-	අත්තිකාරම් ගිණුම්		138,041,254	95,348,387	එෆ්ඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	

-	අත්තිකාරම් ගිණුම්		138,041,254	95,348,387	එසේ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

-	මුළු ආදායම් නොවනලැබීම් (අ)		**9,113,028,341**	6,366,177,400
-	මුළු ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**9,113,028,341**	6,366,177,400
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		325,460,000	49,295,000
	ශුද්ධ ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		8,787,568,341	6,316,882,400
	අඩු කළා : වියදම්			
-	පුනරාවර්තන වියදම්		-	-
2,023,604,000	වැටුප්, වේතනසහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,998,915,401	1,177,414,939
238,521,250	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	204,612,616	167,364,878
501,852,760	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	498,198,611	18,523,516
-	පොළී ගෙවීම්	8	-	-
8,750	වෙනත් පුනරාවර්තනවියදම්	9	8,750	-
2,763,986,760	මුළු පුනරාවර්තනවියදම් (ඊ)		**2,701,735,377**	1,363,303,333
	මූලධන වියදම්			
53,600,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හාවැඩිදියුණු කිරීම්	10	50,301,314	35,023,805
114,583,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	67,415,290	22,835,164

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

-	ප්‍රාග්ධන මාරුකිරීම	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
3,007,000	හැකියා වර්ධනය	14	2,790,663	1,936,568	
-	වෙනත් මූලධන වියදම්	15		-	
171,190,000	මුළු මූලධන වියදම් (උ)		**120,507,267**	59,795,537	
	තැන්පතු ගෙවීම්		2,058,952,132	2,130,108,562	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		212,553,443	93,709,261	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර්ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		2,271,505,575	2,223,817,823	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		5,093,748,220	3,646,916,693	
-	දෙසැම්බර් 31 දිනට්ශේෂය ඒ = (ඉ-එ)		3,693,820,121	2,669,965,707	
	අග්‍රිම ගැලපුම්ප්‍රකාශනය අනුව ශේෂය		3,693,820,121	2,669,965,707	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනටඅග්‍රිම ශේෂය				ඒසිඒ-3
			3,693,820,121	2,669,965,707	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2024 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වයපිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	තත්‍ය 2023 රු.
මූල්‍ය නොවනවත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	3,184,668,823	3,038,395,973
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	360,758,994	286,246,805
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**3,545,427,817**	**3,324,642,778**
ඉද්ධ වත්කම් /ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙතඉද්ධ වත්කම්		127,451,152	80,374,918
දේපළ පිරියත හාඋපකරණ සංචිතය		3,184,668,823	3,038,395,973

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

කුලී හා වැඩඅන්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	233,307,842	205,8
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**3,545,427,817**	**3,324**

පිටු අංක.....සිට ..... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණු
සහඇමුණුම්පිටු අංක ..... සිට ..... දක්වාඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි
කොටස් වේ.මෙම **මූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති
මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලවසිදුකර ඇත.** ඉහත අවසන් ගිණුමෙහිසඳහන්සංඛ්‍යා, ඊට
සටහන් හාඅනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එමසංඛ්‍යා
වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාල
අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවයඅධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරී
අවශ්‍යපරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතිකකරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේනිලධාරි	ගණන්දීමේනිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධානග
නම :එස්.ආලෝකබණ්ඩාර තනතුර : ලේකම්	නම :ජී.එම්.ජනක කේ.ගුණවර්ධන තනතුර :දිස්ත්‍රික් ලේකම්	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (නම : ඩබ්.කේ.කේ.මුතුමාලි
රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	දිස්ත්‍රික්ලේකම් කාර්යාලය , කළුතර	
දිනය :	දිනය :	දිනය :

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

2024 දෙසැම්බර් 31 දිනට
මූලික සම්බන්ධය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
මූලික අනාවරණ වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	ඒසිඒ-6	3,184,668,823	3,038,395,973
මූලික වත්කම්			
අත්තිකාරම් හිඟුම්	ඒසිඒ-5/5(ඒ)	360,758,994	286,246,805
මුදල් හා මුදල් සමාන ද	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		3,545,427,817	3,324,642,778
සුද්ධ වත්කම් / ස්වාමිත්වය			
සාමාන්‍යකාරය වෙත සුද්ධ වත්කම්		127,451,152	80,374,918
දේපල පිරියත හා උපකරණ සංචිතය		3,184,668,823	3,038,395,973
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	-
බැරකම් වගකීම්			
කෙටිකාලීන හිඟුම්	ඒසිඒ-4	233,307,842	205,871,887
දීර්ඝ කාලීන	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		3,545,427,817	3,324,642,778

මීළඟ අංක 1 සිට 19 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන හිඟුම් පහත්කුරු සහ ඇසුරුම් මීළඟ අංක 50 සිට 57 දක්වා ඇතුළත් හිඟුම් සටහන් විස්තර ද මෙම අවසන් හිඟුම්වලින් අත්තරගත කොට ඇත. මෙම මූලික ප්‍රකාශනය සිදුකිරීම රජයේ මූල්‍ය කළමනාකරණ 150 හා 151 යන 2024.12.16 දිනැති රජය හිඟුම් කළමනාකරණ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. මූලික අවසන් හිඟුම්වලින් යදහන් සංඛ්‍යා, රට දෙපළ හිඟුම් සටහන් හා අනෙකුත් හිඟුම් කොටස්වල සාමාන්‍යකාරය හිඟුම් වෙත් සටහන කැඳවීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සටහන දිගහන වන බවටත් මෙයින් සහතික කරමු.

මූලික සාධනය සඳහා වලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන, අධීක්ෂණය කළ හැකිවා හැකිවත් මූලික පාලනය සඳහා අත්තරගත පාලන පද්ධතියේ සවලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අදාළව එම පද්ධතියේ දැඩිකුරු වෙස කියාත්මක කිරීමට අවශ්‍ය පවිත්‍ර වෙනස් කිරීම සිදුකිරීමට එකින් වග කියාලේඛනය සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණකාධිපති නිලධාරී	ගණකාධිපති නිලධාරී	ප්‍රධාන මූලික නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී
නම : එස්. ආලෝකවල්ගාර්	නම : ජී.එම්.ජයන තේ.ගුණවර්ධන	අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/සංස්ථාව
තනතුර : ලේකම්	තනතුර: දිස්ත්‍රික් ලේකම්	නම : ඩබ්.එස් තේ මුදුමාලි
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය , කළුතර	
දිනය : 2025.01.10	දිනය : 2025/02/18	දිනය : 18/2/2025

එස්. ආලෝකවල්ගාර්
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

පී.එම්. ජයන තේ. ගුණවර්ධන
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
කළුතර
ඩිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කළුතර

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

ඒඩිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	
	2024 රු.	**2023** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිහාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	236,087,148	361,830,905
අග්‍රිම ලැබීම්	6,888,599,000	4,280,195,130
අත්තිකාරම් අයකර ගැනීම්	132,954,073	129,015,051
නැන්පතු ලැබීම්	2,086,388,087	1,990,644,832
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**9,344,028,307**	**6,761,685,918**
අඩුකළා : මුදල් වැය කිරීම්		

පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,192,506,672	1,339,289,317
සහනාධාරසහ මාරුකිරීම්	498,198,611	18,523,516
වෙනත්වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	4,025,509,989	2,726,137,098
භාණ්ඩාගාරයටපියවන ලද අග්‍රිම	325,460,000	49,295,000
අත්තිකාරම් ගෙවීම්	122,893,637	141,083,386
තැන්පතු ගෙවීම්	2,058,952,132	2,130,108,562
මෙහෙයුම්ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**9,223,521,040**	**6,404,436,879**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**120,507,267**	**357,249,039**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

<u>අඩුකළා : මුදල් වැය කිරීම</u>		
ප්‍රාග්ධන වියදම්	120,507,267	357,249,039
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**120,507,267**	**357,249,039**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(120,507,267)**	**(357,249,039)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-

මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	-	-

මුදල්වල ඉද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඒසිඒ -2

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 257

දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : කළුතර

රු.

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැයඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරකඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම් (3)	මුළු ශුද්ධප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	2,075,000,000	690,176,760	(1,190,000)	2,763,986,760	2,701,735,377	62,251,383
	(2) ප්‍රාග්ධන	170,000,000	-	1,190,000	171,190,000	120,507,267	50,682,733
	උප එකතුව	2,245,000,000	690,176,760	-	2,935,176,760	2,822,242,644	112,934,116
වැඩසටහන (2)	(1) පුනරාවර්තන	-		-	-	-	-
	(2) ප්‍රාග්ධන	-		-	-	-	-
	උප එකතුව						
							-
	මුළු එකතුව	2,245,000,000	690,176,760	-	2,935,176,760	2,822,242,644	112,934,116

එම්.එල්.එල්.එස්. රණවීර
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කළුතර

ප්‍රධාන ගණකාධිකාරී
දිනය 2025.06.26

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

ඒඩිඒ - 2(i)

වැඩසටහන් අනුවවියදම් ප්‍රකාශනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :
කළුතර

වියදම් ශීර්ෂ අංකය :257

රු.

වැය විෂයය	වැඩසටහන (1)					වැඩසටහන (2)					මුළු වියදම
	ප්‍රතිපාදනය				වියදම	ප්‍රතිපාදනය				වියදම	
	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරුකිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන		අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරුකිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන		
	(1)	(2)	(3)	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)	(8)	(9)=(6)+(7)+(8)	(10)	(11)=(5)+(10)
පුනරාවර්තන වියදම්											
පුද්ගල පඩිනඩි											
1001 වැටුප් හා වේතන	1,217,000,000	-	(53,200,000)	1,163,800,000	1,141,326,270						1,141,326,270
1002 අතිකාල හා නිවාඩු දින වැටුප්	28,000,000	-	1,044,000	29,044,000	28,039,669						28,039,669
1003 වෙනත් දීමනා	579,000,000	197,580,000	54,180,000	830,760,000	829,549,462						829,549,462
ගමන් වියදම්											-
1101 දේශීය	24,200,000	-	8,114,000	32,314,000	31,682,639						31,682,639

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

<u>සැපයීම්</u>											
1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	35,500,000	-	(1,198,750)	34,301,250	30,484,070						30,484,070
1202 ඉන්ධන											
2 ඉන්ධන දීමනාව	12,100,000	-	1,825,000	13,925,000	13,524,437						13,524,437
9 සංචිත වාහන සඳහා ඉන්ධන	16,300,000	-	(945,000)	15,355,000	9,844,390						9,844,390
10 වෙනත් අවශ්‍යතා සඳහා ඉන්ධන	2,000,000	-	-	2,000,000	276,357						276,357
1203 ආහාර පාන හා නිල ඇඳුම්	1,150,000	-	-	1,150,000	495,500						495,500
1205 වෙනත්	150,000	-	-	150,000	130,286						130,286
<u>නඩත්තු වියදම්</u>											
1301 වාහන	14,800,000	-	1,000,000	15,800,000	14,064,324						14,064,324
1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	15,900,000	-	(1,580,000)	14,320,000	12,941,003						12,941,003
1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම්	11,100,000	-	(5,000,000)	6,100,000	3,339,000						3,339,000
1304 මෘදුකාංග නඩත්තු	2,200,000	-	(1,694,000)	506,000	505,398						505,398
<u>සේවා</u>											
1401 ප්‍රවාහන	1,200,000	-	600,000	1,800,000	1,800,000						1,800,000
1402 තැපැල් හා සන්නිවේදන	20,800,000	4,000,000	(1,300,000)	23,500,000	18,913,465						18,913,465

1403 විදුලිය හා ජලය											24,965,171
	30,800,000	-	(4,051,000)	26,749,000	24,965,171						
1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	2,200,000	-	51,000	2,251,000	1,601,907						1,601,907
1405 සනීපාරක්ෂක සේවා	15,300,000	-	-	15,300,000	13,815,662						13,815,662
1407 ආරක්ෂක සේවා	12,800,000	-	-	12,800,000	10,609,813						10,609,813
1409 වෙනත්											
138 යන්ත්‍ර හා කාර්යාලීය උපකරණ සේවාගිවිසුම්	7,900,000	-	-	7,900,000	4,440,796						4,440,796
139 වාහන රක්ෂණ	3,700,000	-	-	3,700,000	2,838,106						2,838,106
140 වෙනත් සේවා වියදම්	5,100,000	-	3,500,000	8,600,000	8,340,293						8,340,293
<u>මාරුකිරීම්</u>											
1504 සංවර්ධන සහනාධාර	-	488,596,760	-	488,596,760	488,271,025						488,271,025
1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී	15,800,000	-	(2,544,000)	13,256,000	9,927,586						9,927,586
<u>පොළී ගෙවීම්</u>											
<u>වෙනත් පුනරාවර්තන වියදම්</u>											
1701 පාඩු සහ කපාහැරීම්	-	-	8,750	8,750	8,750						8,750

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

මුළු එකතුව	2,075,000,000	690,176,760	(1,190,000)	2,763,986,760	2,701,735,377	-	-	-	-	-	2,701,735,377
මූලධන වියදම්											
මූලධන වත්කම් ප්‍රතිරූපණය හා වැඩිදියුණු කිරීම්											
2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම්	47,000,000	-	-	47,000,000	44,886,759						44,886,759
2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	2,600,000	-	-	2,600,000	1,680,278						1,680,278
2003 වාහන	4,000,000	-	-	4,000,000	3,734,276						3,734,276
මූලධන වත්කම් අත්පත් කර ගැනීම											
2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	4,000,000	-	-	4,000,000	3,864,891						3,864,891
2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	4,200,000	-	6,383,000	10,583,000	10,553,875						10,553,875
2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම්	100,000,000	-	-	100,000,000	52,996,524						52,996,524
2106 මෘදුකාංග සංවර්ධනය	5,000,000	-	(5,000,000)	-	-						
ප්‍රාග්ධන මාරුකිරීම්											
මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම											

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

හැකියා වර්ධනය											
2401 කාර්ය මණ්ඩල පුහුණු	3,200,000	-	(193,000)	3,007,000	2,790,663						2,790,663
වෙනත් මූලධන වියදම්					-						
මුළු එකතුව	**170,000,000**	**-**	**1,190,000**	**171,190,000**	**120,507,267**	**-**	**-**	**-**	**-**	**-**	**120,507,267**
මුළු පුනරාවර්තන හා මූලධන වියදම්වල එකතුව	**2,245,000,000**	**690,176,760**	**-**	**2,935,176,760**	**2,822,242,644**	**-**	**-**	**-**	**-**	**-**	**2,822,242,644**

ප්‍රධාන ගණකාධිකාරී
දිනය 2025 · 06 · 26

එම්.එල්.එල්.එස්. රණසිංහ
8	ග්‍රාමනිලධාරී පුහුණු වැඩසටහන - 2024.07.03, 04, 05	128	දින 3	138,750.00		දේශීය	ග්‍රාම නිලධාරී රාජකාරී සම්බන්ධ දැනුම	88,180.00

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

10	අභ්‍යන්තර විගණන පුහුණු වැඩසටහන - 2024.07.10, 11, 12	27	දින 3	37,800.00		දේශීය	විගණන කටයුතු පිළිබඳ පුළුල් දැනුම	27,570.00
11	වාහනවිෂය භාර හා විෂය ආවරණ නිලධාරීන් සඳහා වන පුහුණු වැඩසටහන - 2024.08.26	35	දින 1	13,300.00		දේශීය	වාහන සම්බන්ධ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම	12,425.00
12	කළමනාකරණසේවා නිලධාරි හා සංවර්ධන නිලධාරි පුහුණු වැඩසටහන - 2024	60	දින 2	37,300.00		දේශීය	කාර්යාල කටයුතු හා ලිපිගොනු පිළිබඳ දැනුම	40,850.00
13	ග්‍රාමනිලධාරි පුහුණු වැඩසටහන - 2024.08.07, 08 හා 09	135	දින 3	100,000.00		දේශීය	ග්‍රාම නිලධාරී රාජකාරී සම්බන්ධ දැනුම	76,060.00
14	විනයපුහුණු වැඩසටහන - 2024.08.16	35	දින 1	42,450.00		දේශීය	විනය පිළිබඳ වූ පුළුල් දැනුම	45,503.00
15	ආපදාකළමනාකරණ පුහුණු වැඩසටහන - 2024.12.11	67	දින 1	86,700.00		දේශීය	ආපදා අවස්ථාවන්හි දී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම	88,775.00
16	විනයපුහුණු වැඩසටහන - 2024.12.13	20	දින 1	31,050.00		දේශීය	විනය පිළිබඳ වූ පුළුල් දැනුම	35,775.00
17	ඉඩම්පුහුණු වැඩසටහන - 2024.12.17	54	දින 1	23,350.00		දේශීය	ඉඩම් සම්බන්ධ රාජකාරී පිළිබඳ දැනුම	19,580.00
18	ආකල්පසංවර්ධන පුහුණු වැඩසටහන - 2024.12.18	120	දින 1	43,150.00		දේශීය	ආකල්ප සංවර්ධනය	43,150.00
19	විනයපුහුණු වැඩසටහන - 2024.12.19	16	දින 1	26,270.00		දේශීය	විනය පිළිබඳ වූ පුළුල් දැනුම	26,270.00

	2024.12.19		දින 1	26,270.00		දේශීය	පොත් බෙදාහැරීම පුළුල් දැනුම	26,270.00

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

20	Database Management	30	දින 5	48,000.00		දේශීය		37,460.00
21	Website Maintenance	15	දින 5	45,000.00		දේශීය		34,500.00
22	Computer Networking	20	දින 2	19,000.00		දේශීය		13,500.00
23	Computer Hardware	20	දින 4	27,000.00		දේශීය		20,700.00

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

7 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවේ අනාගතයේදී වළ ගැනීමට යෝජනා නිරවද්‍ය කිරීම/ක්‍රිය
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට නිබීම**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්(වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගඩබා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS)පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	හානි පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ		
2.7	බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	උප පත්‍රිකා පොත් ලේඛණය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් මගහා අනුමත වන පරිදි බලතල පවරාදී නිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම -	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නිබීම	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නිබීම	ඇතැම් විගණන විමසුම් සඳහා අනුකූල නොවේ	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පිළිතුරු ලබා ඉදිරිපත් කල යුතු වීම.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ නිරන්තරසම්බන්ධවීමෙන් පිලිතුරු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කිරීම හා විධිමත් අයුරින් ලබා දීමට ප්‍රාදේශීය කාර්යාල සඳහා උපදෙස් ලබා දීම.
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා නිබීම	89% ක් අනුකූල වේ	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පිළිතුරු ඉදිරිපත් කල යුතු වීම හා මැනිවරණ කාලසීමාවට අයත් වීම.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ නිරන්තරසම්බන්ධවීමෙන් පිලිතුරු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කිරීම හා විධිමත් අයුරින් ලබා දීමට ප්‍රාදේශීය කාර්යාල සඳහා උපදෙස් ලබා දීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4)උප වගන්තිය ප්‍රකාරව,සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3)ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නිබීම	අනුකූල වේ		
7	විගණන කළමණාකරණ කමිටු			
7.1	DMA චක්‍ර ලේඛ 1-2019 අනුව,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන යාම	අනුකූල වේ		
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ කොමිස්ථොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු	අනුකූල වේ		

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

	සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිස්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව,භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූ.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදි අපහරණය කිරීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මූ.රෙ.103,104, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව,වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව,බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම		අක්‍රිය බැංකු ගිණුම් නොමැත	
10.2	සමාලෝචිත වර්ෂයේදි හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රඟෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ප්‍රායෝගිකව මාසයක කාලයක් ප්‍රමාණවත් නොවීම	
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා දී තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මූ.රෙ.94(1)ප්‍රකාරව,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලදීම	අනුකූල නොවේ.	කලයුතු අත්‍යවශ්‍ය ගෙවීම් සිදු කිරීම	
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල	අනුකූල වේ		

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

	විශ්ලේෂණයක් සිදුකර නිබීම			
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහගිටි ණය ශේෂ නිරවුල් කර නිබීම	ඇතැම් ණය ශේෂයන්ට අදාළ අනුකූල නොවේ.		
13	පොදු තැන්පත් ගිණුම්			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම්			
14.1	සමාලෝචිත වර්ෂ අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම,එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර නිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය,භණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	ආදායම් ගිණුම්			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට නිබීම	අනුකූල වේ		
15.2	රැස් කර නිබූ ආදායම තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර නිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණාධිපතිවරයාට වෙත ඉදිරිපත් කර නිබීම	අනුකූල වේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී නිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේනතුව වෙත ඉදිරිපත් කර නිබීම	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබාදීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සකසා නිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර නිබීම	අනුකූල වේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			

18.1	අංක 05/2018 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර නිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට නිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොටනිබීම	අනුකූල වේ		
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට නිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කර නිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට නිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට නිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. WPCG/KL/A/FA/DS/2024/25

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2025 මැයි 26 දින

දිස්ත්‍රික් ලේකම්,
කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුව ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ වාර්තා කිරීමේ පදනමෙහි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මනය තත්ත්වාගණනය කරනු ලැබේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම් විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ වාර්තා කිරීමේ පදනම කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාව සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මෙ වාර්තාව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිත සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙ ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැ වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසි වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලන සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සෑහීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල විධානය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල විධානය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරවී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර නිබුණු ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය නොවන වත්කම් 04 ක අවසන් ශේෂයන්, 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර නිබුණු සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව (SA- 82) එකී වත්කම්වල ආරම්භක ශේෂ එකතුව සමඟ සැසඳීමේ දී රු.70,978,258 ක නොසැසඳුනු වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ස්ථාවර වත්කම් වාර්තාව (SA-82 වාර්තාව) හා සාරාංශ වාර්තාව (SA-80 වාර්තාව) අතර ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ, ඉඩම් හා කෙරිගෙන යන වැඩ යනාදී ස්ථාවර වත්කම්වල වර්ෂය තුළ එකතු කිරීම් හා ඉවත් කිරීම්වල වටිනාකම් එකතුව අතර පිළිවෙලින් රු.69,602,451 ක හා රු.2,587,807 ක නොසැසඳුණු වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තාව (SA-82) සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාවර වත්කම් සංචලන වාර්තාව අතර යන්ත්‍ර හා උපකරණ , කෙරිගෙන යන වැඩ යන ස්ථාවර වත්කම් අයිතම්වල වර්ෂය තුළ එකතු කිරීම්, වර්ෂය තුළ ඉවත් කිරීම් , ආරම්භක ශේෂ සඳහා ගැලපීම් හා හුවමාරු යන එකතු වටිනාකම් අතර පිළිවෙලින් රු.2,609,563 ක, රු.2,230,075 ක, රු.188,542 ක හා රු.83,257 ක නොසැසඳුණු වෙනසක් පැවතුණි.

(ඈ) විගණන නියැදි පරීක්ෂාවට ලක් වූ බණ්ඩාරගම, බෙරුවල, කළුතර, පාලින්දනුවර හා මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විගණනයට ඉදිරිපත් කළ 2024 වර්ෂය සඳහා වූ ස්ථාවර වත්කම් අයිතම් ලැබීම් වාර්තාවට අනුව සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලැබූ ස්ථාවර වත්කම් සංචලන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් එකතු කිරීම් ශේෂ අතර එකතුව රු.8,169,048 ක නොසැසඳුණු වෙනසක් පැවතුණි.

(ඉ) බණ්ඩාරගම, කළුතර, බෙරුවල හා මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා සමාලෝචිත වර්ෂයේ ලැබී නිබූ ප්ලාස්ටික් පුටු 12 ක්, ලැප්ටොප් පරිගණක 02 ක්, ශ්‍රාය පිටපත් යන්ත්‍ර 01 ක්, ඇල්මා කබඩ් 02 ක්, ස්කැනර් 01 ක්, CPU 01 ක් මොනිටර් 01 ක්, තාපෝලියන් ෂීට් 03 ක් සහ සෝලා විදුලි බල්බ 43 ක් ස්ථාවර වත්කම් සංචලන වාර්තාවට අතුළත් කර නොතිබුණු අතර, එම ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේ දී ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) පිරිවැය රු. 12,680,000 ක් වූ කළුතර දිස්ත්‍රික් ලේකම් නිල නිවස හා පිරිවැය විගණනයට ලබා දී නොනිබුණු මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව දෙමහල් ගොඩනැගිල්ලේ වටිනාකම් සමාලෝචිත වර්ෂය අවසානයටත් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත වී නොනිබුණි.

1.6.2 මූදල් ප්‍රවාහ ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නිබූ මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA 82) රු.2,973,511 ක ස්ථාවර වත්කම් විකුණුම් වටිනාකමක් ලෙස එම වත්කම් වල පිරිවැය දක්වා නිබුනමුත් එම ස්ථාවර වත්කම්වල සත්‍ය විකුණුම් වටිනාකම් මූදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූදල් ප්‍රවාහයන් තුළ හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා හෙංචිය වත්කම් විකිණීම යටතේ දක්වා නොනිබුණි.

1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

2024 මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නිබූ SA-82 වාර්තාවේ දැක්වෙන වටිනාකම් රු. 8,731,590 ක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 කට අදාල අනෙකුත් යන්ත්‍ර හා උපකරණ අයිතමවල ආරම්භක ශේෂය සඳහා සිදුකල ගැලපීම් පිළිබඳ විස්තරාත්මක උප ලේඛණ, අනුමැතීන් සහ ප්‍රතල් යටතන් විගණනයට ඉදිරිපත් කර නොනිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොනිබුණි.

විගණන නිරීක්ෂණය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර නිබුණු ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය නොවන වත්කම් 04 ක අවසන් ශේෂයන්, 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර නිබුණු සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව (SA-82) එකී වත්කම්වල ආරම්භක ශේෂ එකතුව සමඟ සැසඳීමේ දී රු.70,978,258 ක නොසැසඳුනු වෙනසක් නිරීක්ෂණය විය.	1.6.1.1. (අ)

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර නිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
154(6) 1.6.1 (අ) (ආ)	නොසැසඳීම් සඳහා සැසඳීම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත්කල යුතු අතර නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය.	1.6.1.1. (අ) (ආ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 19 ක් සඳහා ලබා දී නිබුණු ඒකතුව රු.169,561,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.97,464,334 ක් පමණක් උපයෝජනය කර නිබුණු හෙයින් ඉතිරිවීම රු.72,096,666 ක් වූ අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 92 දක්වා වූ පරාසයක පැවතුණි. ප්‍රතිපාදන ඉතිරිකිරීම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ලබා දී නිබු ඇතැම් හේතූන් පරීක්ෂාවේ දී මූලික හා පරිපූරක ඇස්තමේන්තු සැකසීමේ දී හා මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් අයුතු කිරීමේ දී සලකා බැලිය යුතු සියලුම නිර්නායක පිළිබඳ ප්‍රමාණවත් සැලකිල්ලක් තොරව ප්‍රතිපාදන ඉල්ලුම් කර නිබූ බව මෙන්ම එමගින් එය පාලන කාරකයක් ලෙස ඵලදායීව යොදා ගැනීමට නිබූ අවස්ථාව මගහැරී ගොස් නිබුණි.,

(ආ) වැය විෂයයන් 02 ක් සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ රු.1,614,000 ක ප්‍රතිපාදන ලබා දෙ නිබුණද, එම ප්‍රතිපාදන වර්ෂය අවසාන වනවිටත් උපයෝජනය නොකිරීම මත ශුද්ධ ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස සියයට 7 සිට සියයට 8 දක්වා ඉතිරිවී පැවතුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ආඥාතියේ බැරකම් පිළිබඳ ප්‍රකාශයට අනුව අදාළ ගිණුම් වර්ෂ ඇතුලත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වන්කම් හා සේවාවන් ලැබී ඇති නමු ගිණුම් වර්ෂය තුල දී ඒ සඳහා අදාළ පාර්ශවයන්ට ගෙවීම් සිදු කර නොමැති ගනුදෙනු බැරකම් ලෙ හඳුනාගත යුතු වූවද, 2025 වර්ෂයේ ගෙවීම් වවුචර් පිළිබඳව සිදුකල නියැදි විගණන පරීක්ෂාවේ දී දිස්ත්‍ර ලේකම් කාර්යාලයේ හා කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හඳුනාගත් එම කොන්දේසිය සපුරා

වැය විෂයයන් 09 කට අදාල රු.358,723 ක් බැරකම් ලෙස හඳුනා ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බැරකම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීභාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම් සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන	
(i) XIX පරිච්ඡේදයේ 5.3.2 ඡේදය	අදාළ නිලධාරියාගේ වැටුපෙන් තක්සේරුගත නිවාස කුලී දීමනාව වෙනුවෙන් අයකර ගැනීම් කළ යුතු වුවද ඉංගිරිය හා බණ්ඩාරගම සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ගෙවා තිබුණු තක්සේරුගත නිවාස කුලී දීමනාව වෙනුවෙන් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගත යුතු රු.331,065 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

	(ii) XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය	මාය 01 න් වසර 8 ත් අතර කාලයකට පෙර ගිය නිලධාරීන් 06 දෙනෙකුට අදාළ එ රු.741,373 ක ණය ශේෂයක් අදාළ විධිවි ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයටත් නි කර ගෙන නොතිබුණි.
	(iii) XXIV පරිච්ඡේදයේ 4.2.2, 4.2.4, 4.2.5, 4.5, 4.6 හා 6.3	නිලධාරියා විශ්‍රාම ගොස් මාය 03 කට කාලසීමාවක් ගත වී තිබුණ ද අය කර නෙ එකතුව රු.597,689 ක ණය ශේෂ 04 ක් පැවතු
	(iv) XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6	විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නිරවුල් නොගත් වැඩ තහනම් කරන ලද නිලධාරියෙකුගෙන් අය විය යුතු එ රු.184,030 ක ණය ශේෂයක් පැවතුණි.
	(v) XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති	තනතුර හැර ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් විය යුතු එකතුව රු.445,495 ක ණය සමාලෝචිත වර්ෂය අවසානයටත් විධිවි ප්‍රකාරව අය කර ගෙන නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසි	
	(i) මූල්‍ය රෙගුලාසි 396(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේ කාර්යාල 02 ක බැංකු ගිණුම් 02 හින් නිකුත් නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාය 06 ක සී මාව ඉක්මවා තිබූ වටිනාකම රු.814,848 ක වෙක්පත් 12 ක් සම්බන්ධයෙන් මූල්‍ය රෙගු ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මේ අ වටිනාකම රු.771,083 ක් වූ වෙක්පත් 08 ක් 06 ඉක්මවීමෙන් පසු නිරවුල්කර තිබුණි.
	(ii) මූල්‍ය රෙගුලාසි 880 හා 2022 මාර්තු 16 දිනැති අංක 04/2022 ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය	ඇප තැබිය යුතු යැයි නියමකර ඇති රජයේ සි නිලධාරීන් විසින් 612 වැනි අධිකාරිය වන රා නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව තැබිය යුතු වුවද කළුතර දිස්ත්‍රික් ලේ කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 0

		එලෙස ඇප නැබියයුතු නිලධාරීන් 62 දෙනෙකු විසින් වක්‍රලේඛ ප්‍රකාරව නැබිය යුතු රු.505,300 ක ඇප වටිනාකමින් කිසිදු මුදලක් තැන්පත් කර නොනිබුණු අතර තවත් නිලධාරීන් 10 දෙනෙකු විසින් එලෙස නැබියුතු ඇප වටිනාකමට වඩා රු.82,355 ක් අඩුවෙන් තැන්පත් කර තිබුණි.
(ඇ)	(i) 2016 පෙබරවාරි 25 දිනැති අංක 3/2016 රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය	2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම ලබන විශ්‍රාමිකයන් සඳහා මසකට රු.3,500 ක අන්තර් දීමනාව නොගෙවිය යුතු වුවද, පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් විශ්‍රාමිකයෙකු සඳහා එලෙස රු.3,500 ක මාසික දීමනාව ගෙවා නිමීම හේතුවෙන් රු.280,000 ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි.
	(ii) 2016 පෙබරවාරි 25 දිනැති අංක 3/2016 රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය හා 2019 ජූනි 11 දිනැති අංක 01/2019 දරන විශ්‍රාම වැටුප් වක්‍රලේඛය	රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ 03/2016 ට ගැලපෙන විශ්‍රාම වැටුපක් නැවත විශ්‍රාම වැටුප් වක්‍රලේඛ 01/2019 අනුව සංශෝධනය කිරීම අවශ්‍ය නොවූණ ද පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමිකයන් 06 දෙනෙකු සඳහා එලෙස විශ්‍රාම වැටුප නැවත සංශෝධනය කර 2019 ජූලි මස සිට 2024 දෙසැම්බර් මස දක්වා ගෙවා නිමීම හේතුවෙන් රු.1,636,902 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි.
	(iii) 2019 මැයි 30 දිනැති අංක 02/2019 රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ ලිපිය, 06 ඡේදය	මිය ගිය විශ්‍රාමිකයන්ගේ නොරතුරු කාලීනව ලබාගෙන විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ නාමලේඛනය යාවත්කාලීන නොකිරීම මත පානදුර, බෙරුවල, හොරණ හා කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2024 දෙසැම්බර් 31 දිනට මිය ගිය විශ්‍රාමිකයන් 51 දෙනෙකු වෙනුවෙන් අවිධිමත් ලෙස වැඩිපුර ගෙවීම් කර තවදුරටත් අයකර ගත යුතු රු.1,748,003 ක මුදලක් පැවතුණි.
(ඈ)	2019 ජූනි 11 දිනැති අංක 14/2019 දරන විශ්‍රාම වැටුප් වක්‍රලේඛය	විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමෙන් අනතුරුව මෙතෙක් ගෙවූ අන්තර් දීමනාව නතර කළ යුතු වුවද යන්නද්ධ සේවා / පොලිස් වැන්දඟු විශ්‍රාම වැටුප්

	චක්‍රලේඛයට අනුව ගැලපීමෙන් පසුව ද වැන්දු විශ්‍රාම වැටුප සමඟ ඒකාබද්ධව ගෙවනු ලබන යැපී දිමනාව සඳහා වූ අන්තර් දිමනාව 2019 ජූලි මස සි 2024 දෙසැම්බර් මාසය දක්වා ම විශ්‍රාමිකයින් 0 දෙනෙකු සඳහා ගෙවා නිමීම හේතුවෙන් රු.1,254,000 ක වැඩිපුර ගෙවීමක් සිදු වී නිබුණි.
(ඉ) 2019 මැයි 31 දිනැති අංක 14/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	පානදුර, කළුතර, හොරණ, පාලින්දනුවර, වලල්ලාවිට, මතුගම හා බේරුවල, යන ප්‍රාදේශී ලේකම් කාර්යාල 07 හි විශ්‍රාම වැටුප් ලිපි ගොනු 269 ක් 2024 දෙසැම්බර් 31 දිනටත් චක්‍රලේඛ ප්‍රකාරව සංශෝධනය කර නොනිබුණි.
(ඊ) 2019 ජූලි 26 දිනැති අංක 01/2019 සංශෝධන II විශ්‍රාම වැටුප් චක්‍රලේඛය	නිවැරදි හඹුදා මඟින් ගෙවනු ලබන වයස අවුරුදු 55 දක්වා වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයන්ට මෙ 01/2019 වැටුප් සංශෝධනය අදාළ නොවන බ දක්වා නිසිය දී ඵලෙස් හඹුදා වැටුප් ලබන එ විශ්‍රාමිකයකුගේ වැටුප 01/2019 චක්‍රලේඛයට අනු සංශෝධනය කර 2019 ජූලි මස සිට 202 දෙසැම්බර් මස දක්වා ම ගෙවා නිමීම හේතුවෙ රු.301,277 ක වැඩිපුර ගෙවීමක් සිදු කර නිබුණි.
(උ) 2019 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	යෑම ඉන්ධන පරීක්ෂාවකින් මාස 12 කට පමාවකින් පසුව හෝ කිලෝ මීටර 25,000 ක ප්‍ර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව යන කාර අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැව ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකල යුතු වූව විගණන නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශී ලේකම් කාර්යාලය 03 ක් සතු වාහන 06 කට ස දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු එක් වාහනයක අදාළව එසේ ඉන්ධන දහනය පිළිබඳව කාලී පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.
(ඌ) අංක 09/2009 දරන 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ IV උප ඡේදය හා අංක 02/2021 (VIII) දරන	වේලාව පදනම් කර ගනිමින් අනිකාල හා නිවා දින වැටුප් ආදී නිත්‍ය රාජකාරි වේලාවෙන් පස ගෙවනු ලබන දිමනා සඳහා කාලය පදනම් ක

	2023 මැයි 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය	ගන්නේ නම් එම කාලය ඇතිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කල යුතු වුවද වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇතැම් නිලධාරීන් හා සේවකයින් විසින් ඇතිලි සලකුණු යන්ත්‍රය සිය පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා භාවිතා නොකර එකී කාල සීමා සඳහා අනිකාල හා නිවාඩු දින වැටුප් ලබාගෙන තිබුණි.
(ඒ)	i. 2021 සැප්තැම්බර් 29 දිනැති, අංක PFD/PMD/Cir/2021/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.1 හා 2.3 ඡේද	චක්‍රලේඛයේ යදහන් කරුණුවලට පටහැනිව 2024 වර්ෂයේදී කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක් ලබාදී නිබූ ප්‍රජා මූල සංවිධාන පිළිබඳව ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.
	ii. එම චක්‍රලේඛයේ 2.5 ඡේදය	පවරනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ප්‍රජා පාදක සංවිධානයේ/ සමිතියේ බල ප්‍රදේශ සීමාවන් තුල විය යුතු වුවද කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකිරීම් ව්‍යාපෘති බල ප්‍රදේශ සීමාවෙන් පිටත ප්‍රජා පාදක සමිති වෙත ද ලබා දී තිබුණි.
	iii. 2024 ජනවාරි 19 දිනැති අංක MOH/RRD/PL/I/GEN/2024 දරන ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3 ඡේදය	ව්‍යාපෘති නෝරාගැනීමේ නිර්නායකයන්ට අනුගත නොවන මාර්ග සඳහාද සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි.
	iv. 2022 නොවැම්බර් 29 දිනැති මහජන ආරක්ෂක අමාත්‍යාංශ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 06 දරන චක්‍රලේඛය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ලියාපදිංචි කර ඇති ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන මඟින් වාර්ෂිකව ලබා දිය යුතු ලේඛන දක්වා තිබුණු අතර සෑම සංවිධානයකට ම අදාළව එම තොරතුරු වාර්ෂිකව ලබාගෙන සංවිධානයේ මුල් ගොනුවට ඇතුළත් කලයුතු වුවද නියැදි පරීක්ෂාවට ලක් වූ කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක ලියාපදිංචි ස්වේච්ඡා සංවිධාන 05 කට අදාළව සමාලෝචිත වර්ෂයේ තොරතුරු එලෙස යාවත්කාලීන කර නොතිබුණි.

3.5 නැන්පතු

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පොදු නැන්පත් ගිණුම් 6 ක එකතුව රු.233,307,842 ක ශේෂය පැවති අතර ඒ අතුරින් පොදු නැන්පත් ගිණුම් 3 කට අදාළව වසර දෙකක් ඉක්ම වූ නිරවුල් කර නොතු එකතුව රු.10,787,728 ක නැන්පතු ශේෂයක් පැවතුණි. එසේම එකී ශේෂය තුල එකතුව රු.1,235,951 වූ වසර 5 ක් ඉක්ම වූ නැන්පතු ද පැවති අතර, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) විධිවිධ ප්‍රකාරව පවතින අඩුපාඩු හා දෝෂ නිවැරදි කර අදාළ පාර්ශව වෙත නැන්පත් මුදල් ගෙවා දැමීම රජයේ ආදායමට බැර කිරීමට හෝ විධිමත් පියවර ගෙන නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම හා ප්‍රගතිය ඇගයීම

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කර අනුමත කර ගෙන නියමිත කාල සීමාව තුල ඉදිරිපත් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ ඉදිරිපත් කර නිබු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඇතැම් අංශවල ක්‍රියාකාරීත්වය ඇගයීම සඳහා අවශ්‍ය වන ප්‍රධ කාර්යසාධන දර්ශක කිසිවක් ඉදිරිපත් කර නොතිබුණු අතරම ක්‍රියාකාරී සැලැස්මේ ඉදිරිපත් කර නිබු ඇතැම් අංශවල අපේක්ෂිත ප්‍රතිඵලය, භෞතික/ මූල්‍ය ඉලක්ක ප්‍රතිදානය, ප්‍රතිඵලය හා වගකිව යුතු නිලධ යන ක්ෂේත්‍රයන් සඳහන් කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යා විසින් ඉදිරිපත් කර තිබුණු ප්‍රගති වාර්තා ක්‍රියාකාරී සැලසුම්වලට අනුගතව ඉදිරිපත් කර නොති හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධනය මැන බැලීම කළ නොහැකි විය.

4.1.2 කමිටු ක්‍රියාකාරීත්වය

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන විවිධ කමිටු අතරින් කමිටු 05 ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් වූ තොරතුරු ආශ්‍රයෙන් සිදු කළ පරීක්ෂාවේ දී මසකට ම වරක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, පරිසර කමිටුව සහ ඩෙංගු මර්ධන කමිටුව රැස් විය වුව ද, සමාලෝචිත වර්ෂය තුළ එය වාර 04 ක් පමණක් රැස් වී නිබුණු අතර, වසරක් තුළ 03 වරක් රැස් යුතු දිස්ත්‍රික් මන්ද්‍රව්‍ය නිවාරණ කමිටුව වසර තුළ රැස් වී නිබුණේ එක් වරක් පමණක් විය. තවද වසරක් මසකට වරක් බැගින් පැවත්විය යුතු දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව ද සමාලෝචිත වර්ෂය තුළ රැස් වී නිබු වාර 06 ක් පමණක් විය. ඒ අනුව දිස්ත්‍රික්කය තුළ ඵලදායී, අර්ථවත් සේවාවක් ප්‍රවර්ධනයන් වෙන සැල සඳහා යෝජිත කමිටුවල නියි හා කාලීන ක්‍රියාකාරීත්වය අනිශය වැදගත් වන නමුත් එම කමිටුවල කා ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි.

4.1.3 අර්ධ නිමි ව්‍යාපෘති ඉදිකිරීම

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් ව්‍යාපෘතියේ උපදේශක ආයතනයේ නොරතුරුවලට අනුව කොන්ත්‍රාත්තුවේ අතුරු ගෙවීම් සහතික අංක 20 දක්වා වන ගෙවීම් අනුව අයකර ගත යුතු සමුච්චිත ප්‍රමාද ගාස්තුව රු.3,634,307 ක් වූ නමුත් 2024 දෙසැම්බර් 31 දින දක්වාත් එය අයකර ගෙන නොතිබුණි. ඉදිරිපත් කර තිබුණු අවසන් බිල්පත වූ අතුරු ගෙවීම් පත් 20 ට අනුව ඉටුකර තිබුණු අතිරේක වැඩ වටිනාකම රු.8,358,049 ක් වුව ද ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදන ප්‍රකාර ව නිසි අනුමැතිය ලබාගෙන නොතිබූ අතරම විශේෂ මිල විශ්ලේෂණ ද (SSR), විධිමත් විචලනා ඇණවුම් ද (Formal variation Orders) ඉදිරිපත් කර නොතිබුණි. උපදේශක ආයතනය විසින් ලබා දී තිබුණු සැසඳුම් වාර්තාවට අනුව ඇස්තමේන්තු ප්‍රමාණ පත්‍ර අනුව අඩුවෙන් ඉටු කළ වැඩ හා ඉටු නොකළ වැඩවල වටිනාකම රු.17,841,791 ක් වූ අතර ප්‍රමාණ පත්‍ර වලට වඩා වැඩියෙන් ඉටු කළ ප්‍රමාණය (Excess) රු.9,480,932 ක් විය. විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී කොන්ත්‍රාත්තුව ඉටු කිරීම සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව ඉටු නොකළ වැඩ පැවතුණි. එනම්, ඩීසල් විදුලි ජනක යන්ත්‍රය සපයා සවිකර නොතිබීම, ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතිය යටතේ ලැබිය යුතු Multi Media යන්ත්‍රය සහ ඒ හා සම්බන්ධ වන (HDMI/VGA Audio) කේබල් සහ ශබ්ද පරිපාලනයට අවශ්‍ය Speaker Stand 02 ක් ලබා දී නොතිබීම, ශබ්ද පරිපාලන පද්ධතිය සඳහා අවශ්‍ය Snake Cable ලබා දී නොතිබීම, නව ගොඩනැගිල්ල සඳහා ජල සැපයුම පිණිස අවශ්‍ය වන ජල ටැංකි හා ජල මෝටරය සම්බන්ධිත පද්ධතිය ක්‍රියාත්මක නොවන අතර ජල මෝටරය සඳහා නව ගොඩනැගිල්ලේ විදුලි සැපයුම් ස්ථාපිත කර නොතිබීම හා Fire Smoke detecting System මෙ වන විටත් ක්‍රියාත්මක තත්ත්වයට පත්කර නොතිබීම යන ප්‍රධාන අඩුපාඩු පැවතුණි. තවද ඉදිකිරීම් ප්‍රමිතියෙන් බැහැර වීම් සහ අවශ්‍ය අවස්ථාවන්හි දී ඉදිකිරීම් පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු නොකිරීම නිසා ඇතිවී තිබුණු ඉදිකිරීම් දෝෂ 20 කට අධික සංඛ්‍යාවක් පැවතුණි. කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ඉටුකළ වැඩවල දක්නට ලැබුණු අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස කොන්ත්‍රාත්කරුට අවස්ථා කිහිපයක දී දැනුම් දී තිබුණු නමුත් එම අඩුපාඩු සියල්ල නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණු අතරම නිවැරදි කිරීමට කටයුතු කර තිබුණු ඇතැම් අඩුපාඩුවල නිවැරදි කිරීම්ද නිසි පරිදි ඉටුවී නොතිබුණු බව උපදේශන ආයතනය විසින් (CECB) තහවුරු කර තිබුණි. මීට අමතරව ඉදිකිරීම් නිම කිරීමට අදාළව වැඩ අවසන් කල බවට වාර්තාවක් (Completion Certificate), ඉදිකිරීම් සහ සවිකිරීම් බාරදුන් බවට වාර්තාවක්, (Handing Over Certificate) වැඩ නිම කළ පසු ලබා දෙන සැලසුම්, (As built drawing) විදුලි උපාංග සම්බන්ධ වරලත් විදුලි ඉංජිනේරු වාර්තාවක්, සවිකර ඇති අනිකුත් උපාංග සඳහා වූ වොරන්ටි සහ ගැරන්ටි සහතික සහ කොන්ත්‍රාත්කරුගේ වගකීම් සහතිකය ද ලබා දී නොතිබුණි. විදුලිය සහ ගිනි ආරක්ෂක පද්ධතිය පිළිබඳ පරීක්ෂණ සහ ස්ථාපිත කිරීම් ද (Testing &

Commissioning) සම්පූර්ණ කර නොනිබුණු අතරම අවසන් බිල්පත ද මෙම වාර්තාවේ දිනය දක්වා ඉදිරිපත් කර නොනිබුණි.

මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ සම්පූර්ණයෙන් අවස්ථ කිරීමට පෙර කොටස් වශයෙන් නිම කර නිබුණ ඉදිකිරීම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වරින් වර භාවිතයට ගැනීම සිදුකර නිබුණු අතර කොන්ත්‍රාත්තුව දෙපාර්ශවයේ ම එකඟතාවයෙන් නීත්‍යානුකූලව අවසන් කිරීමට (Mutual Termination) තීරණය කර නිබුණ ද 2025 මැයි වන විටත් එය සිදුකර නොනිබුණි

(ආ) බෙරුවල, හොරණ බණ්ඩාරගම, පානදුර, අගලවත්ත, දොඩංගොඩ, මතුගම හා කළුතර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ තුල විවිධ ප්‍රතිපාදන මූලාශ්‍ර මගින් ලද රජයේ අරමුදල් මගින් ඉදිකිරීම් ආරම්භ කර එකතු ආසන්න පිරිවැය රු. 42,884,718 ක් දරා අදාළ ගොඩනැගිලිවල ඉදිකිරීම් වලින් කොටසක් පමණක් නිමකර දීර්ඝ කාලයක් නිස්සේ එම ගොඩනැගිලිවල ඉතිරි කොටස් සම්පූර්ණ කිරීමකින් තොරව පවතින ගොඩනැගිලි 27 ක් හා එලෙස කොටස් ඉදිකිරීම් සඳහා වැය කළ පිරිවැය ඵලදායී නොහැකි තත්ත්ව අර්ධ වශයෙන් නිම ගොඩනැගිලි 04 ක්ද පැවතුණි. මෙම ගොඩනැගිලිවල ඉදිකිරීම් ආරම්භ කර මේ වන විට වසර 02 සිට 26 දක්වා කාලසීමාවක් ගත වී නිබුණු අතර මෙම ඇතැම් ඉදිකිරීම් අත්හිටුවාරමට සහ කුලුණු සඳහා යෙදුවානේ කම්බිවලට පවණ් සිමා වී නිබූ අතර එම කොටස් ද දීර්ඝ කාලයක සිට අව් වැසිවලට නිරාවරණය වී පැවතීම හේතුවෙන් ඒවා නැවත භාවිතයට ගත නොහැකි තත්වයට පත්ව නිබීම හේතුවෙන් ඒ සඳහා වැය කළ රජයේ මුදල් නිශ්ඵාර්ය බවට පත්ව නිබුණි.

(ඇ) අංක 408-02-03-08 දරන වැය ශීර්ෂය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය ව සාම්ප්‍රදායික ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන යටතේ ජාතික ශිල්ප සභාව මගින් වේවැ පුහුණු මධ්‍යස්ථානයක් හා අමුද්‍රව්‍ය බැංකුවක් ස්ථාපිත කිරීම සඳහා 2021 සහ 2022 වර්ෂවල ලබා නිබුණු රු.4,365,000 ක ප්‍රතිපාදන උපයෝගී කර ගෙන 2022 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම්වලින් කොටසක් පමණක් නිමකර නිබුණි. මෙහි ඉතිරි ඉදිකිරීම් සඳහා 2023 වර්ෂයේ රු.7,500,000 ක් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙන් කර නිබුණ ද 2023 දෙසැම්බර් දිනට පෙර ව්‍යාපෘති ඉදිකිරීම් ආරම්භ කර නිම කිරීමේ හැකියාවක් නොමැති බව පවසමින් ප්‍රතිපාදන ප්‍රතික්ෂේප කර 2024 වර්ෂය වෙනුවෙන් අදාළ ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලුම් කර නිබුණි. ඒ අනුව මෙම ඉදිකිරීම් සඳහා 2024 වර්ෂයේ දී ජාතික ශිල්ප සභාව විසින් රු.9,900,000 ක ප්‍රතිපාදන වෙන් කර නිබුණ ද එකී ප්‍රතිපාදන උපයෝගී කරගෙන අදාළ ව්‍යාපෘතිය එම වර්ෂයේ දී නිම කිරීමට කටයුතු කර නොනිබුණි. මේ අතර අදාළ ස්ථානයේ ඉදිකිරීම් සිදු කරන්නේ නම් නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසිවලට යටත්ව ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාගත යුතු බවට මධ්‍යම පරිසර අධිකාරිය හා එම කර්මාන්තයට අදාළව අනුමැතිය ලබාගත යුතු ආයතන වෙතින් අදාළ අනුමැතීන් ලබාගත යුතු බවත්, 2024 අගෝස්තු 07 දින බුලත්සිංහල ප්‍රාදේශීය සභාව විසින් දැනු

දී නිබුණ ද එම අවසරය ලබාගෙන අදාළ ඉදිකිරීම නිම කිරීමට මෙම වාර්තාවේ දිනය තෙක්ම කටයුතු කර නොනිබුණි.

(ඇ) හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පවත්වා ගෙන යනු ලබන නව ගොඩනැගිල්ලේ අවසන් අදියර 2017 වර්ෂයේ වැඩ ආරම්භ කර රු.32,435,820 ක වියදමින් 2015 වර්ෂයේ වැඩ අවසන් කර නිබුණු අතර, නැවත 2016 වර්ෂයේ රු.1,996,502 ක පිරිවැයක් යටතේ වැඩ අවසන් කිරීම සඳහා අමතර වැඩ කොටසක් ද ඉටු කර 2017 වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට කාර්යාල කටයුතු සඳහා භාවිතයට ගෙන නිබුණි. ගොඩනැගිල්ල සාදා නිම කර සුළු කාලයක් ගතවීමේ දී මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීමවල දෝෂ රාශියක් ඇතිවී ගොඩනැගිල්ල භාවිතයේ දී ගැටළු රාශියකට මුහුණ දීමට සිදු වී නිබුණු අතරම කොන්ත්‍රාත්කරු වෙත අවස්ථා 04 ක දී මෙම අඩුපාඩු නිවැරදි කරන ලෙස සිහිකැඳවීම් යවා නිබුණ ද ඔහු එම දෝෂ නිවැරදි කිරීමට 2025 මාර්තු දක්වා කටයුතු කර නොනිබුණි. එයේ වුවද මෙම කොන්ත්‍රාත්කරුට නැවතත් කොන්ත්‍රාත් ලබා දී නිබුණු අතරම නව ගොඩනැගිල්ලේ ඉහළ මහලේ දේගන ශාලාවට අතුරන ලද වර්ග මීටර් 7.7 ක ප්‍රමාණයක ටයිල් ගැලවී යාම හේතුවෙන් 2023 වර්ෂයේ දී රු. 803,290 ක් වැය කර නැවත ටයිල් අතුරා නිබුණි. ඉදි කිරීම් නිමකර ඉතා සුළු කාලයක දී ඉහත පරිදි දෝෂ ඇතිවීම නියමිත ප්‍රමිතීන්ගෙන් බැහැරව ඉදිකිරීම් සිදුකළ කොන්ත්‍රාත්කරුවන්ගේ හා අධීක්ෂණ නිලධාරීන්ගේ අඩුපාඩු හේතුවෙන් ඇති වූ දුර්වලතා වන අතර විශේෂයෙන් මළාපවාහන පද්ධතිය හා ජල පවාහන පද්ධතියේ දෝෂ කඩිනමින් නිවැරදි කළ යුතුව පවතින බවත්, මේම දෝෂ නිවැරදි කර ගැනීමට as bill drawings සොයා ගෙන නිවැරදි කිරීමේ කටයුතු සිදුකළ යුතු බවත් නිරීක්ෂණය කරන අතරම මෙවැනි ඉදිකිරීම් ප්‍රමිතියෙන් තොර අඩුපාඩු සහිතව නිම කළ කොන්ත්‍රාත්කරුවන්හට නැවත කොන්ත්‍රාත් ප්‍රදානයේ දී සැලකිලිමත් විය යුතු අතරම මෙම වැඩ අධීක්ෂණයට ලක් කළ නිලධාරීන් සම්බන්ධයෙන් ද නිසි ක්‍රියාමාර්ග ගත යුතුව පැවතුණි.

4.1.4 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතා කරනු ලබන වාහන 04 ක අයිතිය දිස්ත්‍රික් ලේකම් නමට පවරාගෙන නොනිබුණු අතර දිස්ත්‍රික් ලේකම් නමින් ලියාපදිංචි වී ඇති මෝටර් බයිසිකල් 15 ක් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී නිබුණි. කළුතර දිස්ත්‍රික් ලේකම් නමින් ඇති මෝටර් බයිසිකල් 05 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ආපදා ඒකකය වෙත අනුයුක්ත කර නිබුණ ද එම මෝටර් බයිසිකල් සඳහා වූ දෛනික ධාවන සටහන් මාසිකව එකී ආයතන වෙතින් විගණනයට ඉදිරිපත් කර නොනිබුණි. දිස්ත්‍රික් ලේකම් නමින් ලියාපදිංචි වී නිබූ ට්‍රැක්ටර් 05 ක් සහ බවුසර් ට්‍රේලර් 07 ක් දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර නිබුණ ද ඒවා භාවිතා නොකරනු ලබන බවත්, විවිධ අවස්ථාවල දී ඒවා ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා වෙත ලබා දී ඇති බවත් එම ට්‍රැක්ටර් සහ බවුසර් ට්‍රේලර් එම ප්‍රාදේශීය සභා විසින් භාවිතා නොකරන බවත් දැනට ඒවායේ අවශ්‍යතාවයක් නොවන බැවින් ආපසු ප්‍රාදේශීය ලේකම්

/දිස්ත්‍රික් ලේකම් වෙත බාරදීමට ඉල්ලීම් සිදු කර ඇති බවත් නිරීක්ෂණය වූ අතර, මෙ සම්බන්ධව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණය ප්‍රමාණවත් වී නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අංක 252 – 9801 දරන ඉසුසු (ISUZU) වර්ගයේ කැබ් රථය බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පවරා නිබුණු අතර අංක PA – 1115 දරන රෙනෝල්ට් වර්ගයේ ගිලන් රථයේ ලියාපදිංචි අයිතිය අහෝසි කර කළුතර කාර්මික විද්‍යාලයට බාරදී නිබුණ ද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දන්න පද්ධතියට අනුව එම මෝටර් රථ සමාලෝචිත වර්ෂය අවසානයටත් දිස්ත්‍රික් ලේකම් වෙත් පැවතුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පරිහරණය කරනු ලබන මෝටර් රථ අලුත්වැඩියා කිරීමවල දී ඒ සඳහා කැඳවූ මිල ගණන් විභාග ඒවා බවටත් ඒවා එකම ගරාජයකින් ලබාගෙන නිබු බවටත් හෙළිදරව් වී නිබියදීත් එම ගරාජ අසාධු ලේඛන ගත නොකිරීම හා ඒ සඳහා මැදිහත් වූ වගකිවයුත්තන් සඳහා ප්‍රමාණවත් විනය ක්‍රියාමාර්ග නොගැනීම, (අංක PA-4972 දරන කැබ් රථය) එමෙන්ම ඉන්පසුව සිදු කළ අලුත්වැඩියා සම්බන්ධව ප්‍රසම්පාදන කමිටුවල දී ඉදිරිපත් වන මිල ගණන්වල නිර්විෂමතාවය පිළිබඳ ප්‍රමාණවත් නහවුරුවක් ලබා නොගැනීම, ගරාජය විසින් අලුත්වැඩියාව සඳහා පළමුවි අඩු ලංසුවක් ඉදිරිපත් කර එම ආයතනයට අලුත්වැඩියාවට රථ යොමු කල විට වෙනත් දෝෂ පවතින බව දන්වා වැඩි මුදලකට ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම අබණ්ඩව සිදුවී නිබීම, අලුත්වැඩියා හා අමතර කොටස් යෙදීම, ටයර් හා බැටරි යෙදීම යනාදිය පිළිබඳ ලොග් පොත්වල යටහන් නොයෙදීම, අලුත්වැඩියා හා ටයර් යෙදීමවල දී මෝටර් රථ පරීක්ෂක ලවා පෙර හා පසු පරීක්ෂා සිදුකරවාගෙන නොනිබීම, නියමිත දුර සීමාවන් තුල මොටර් රථවල Wheel Alignment සිදු නොකිරීම හේතුවෙන් ටයර්වල ආයු කාලය අඩුවීම ආදී පද්ධති හා පාලන දුර්වලතා රාශියක් නිරීක්ෂණය වී නිබුණි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන උපයෝජනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පිළිවෙන් නොමැති වීම මෙන්ම පවත්නා අභ්‍යන්තර පාලන පිළිවෙන් නොපිළිපැදීම් ද නිරීක්ෂණය වූ අතර, මෝටර් රථ උපයෝජනය සම්බන්ධයෙන් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විෂයය භාර නිලධාරීන්ට ප්‍රමාණවත් පුහුණුවක්, අවබෝධයක් හෝ නිසි සම්බන්ධීකරණයක් නොමැතිවීමේ තත්ත්වයන් ද පැවතුණි.

4.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2021 යටතේ ග්‍රාම සේවා වසම් 05 ක එක් ප්‍රතිලාභියෙකුට රු.100,000 බැගින් තෝරාගත් ප්‍රතිලාභීන් 61 දෙනෙකු හට විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා රු.6,100,000 ක මුදලක් ලබා දී නිබූ අතර සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳව 2024 ඔක්තෝබර් 25 දින සිදුකල පරීක්ෂාවේ දී ප්‍රතිලාභ ලබාගත් එක් ප්‍රතිලාභියෙකු විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන ව්‍යාපෘතියේ ටැංකි කිසිවක් සාදා නොනිබුණු අතර, තවත් ප්‍රතිලාභීන් තිදෙනෙකු විසින් ව්‍යාපෘති යෝජනාව මඟින් නිර්දේශ කර නිබුණු

ටැංකි 10 ම ඉදිකර නොනිබුණි. එසේම ප්‍රතිලාභීන් සිව් දෙනෙකු ටැංකි යාදා වැඩ නිම කර නිබුණු නමුත් ව්‍යාපෘතියේ අවසාන අරමුණ වන විසිතුරු මසුන් තැන්පත් කිරීම සිදුකර නොතිබුණි.

(ආ) හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2021 යටතේ ඔලබොඩුව බිම්මල් වගාව ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.7,795,419 ක් වැයකර නිබුණි. 2024 සැප්තැම්බර් 30 දිනට ප්‍රතිලාභීන් 14 දෙනෙකු විදේශ ගත වීම, පදිංචිය මාරු කිරීම වැනි විවිධ හේතු මත උක්ත කර්මාන්තයෙන් බැහැර වී හෝ තාවකාලිකව කර්මාන්තය නවතා දමා නිබුණි. දිස්ත්‍රික් ලේකම්ගේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන තිරසරභාවය පවත්වා ගැනීම සඳහා වන උපදෙස් මාලාවට අනුව ව්‍යාපෘතිය මඟින් පෞද්ගලික පරිහරණයට ලබා දී ඇති ද්‍රව්‍ය හා උපකරණ උෂ්ණ උපයෝජනයට ලක් කරන්නේ නම් ප්‍රතිලාභී හිමිකමින් ඉවත් කොට ඒවා වෙනත් සුදුසු ප්‍රතිලාභීන්ට ලබා දීම සිදු කළ යුතු බව දක්වා නිබුණ ද ඉහත කර්මාන්තයෙන් බැහැරව ගිය හා තාවකාලිකව කාර්මාන්තය නවතා දැමූ ප්‍රතිලාභීන් 26 දෙනා අතරින් එක් ප්‍රතිලාභියෙකුගෙන් පමණක් භාණ්ඩ ආපසු පවරා ගෙන තිබූ අතර, තවත් ප්‍රතිලාභීන් 04 දෙනෙකුගෙන් රු.110,000 ක මුදලක් පමණක් අයකර ගෙන නිබුණි. එමෙන්ම 2024 සැප්තැම්බර් 30 දිනට නිෂ්පාදන කටයුතු තාවකාලිකව නතර කර ඇති පුද්ගලයින් 12 දෙනෙකු වෙත ලබා දී නිබුණු භාණ්ඩ හා උපකරණ ද උෂ්ණ උපයෝජිතව පවතින නමුත් එම ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොනිබුණි. උක්ත ව්‍යාපෘතිය යටතේ බිම්මල් නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා පොදු පහසුකම් මධ්‍යස්ථාන 02 ක් පෞද්ගලික ඉඩම් 02 ක ස්ථාපනය කර තිබූ අතර, එහි පොදු පරිහරණය සඳහා බිම්මල් මාධ්‍ය මිශ්‍ර කිරීමේ හා පැකට් කිරීමේ යන්ත්‍ර සහ බිම්මල් තම්බන යන්ත්‍ර 01 බැගින් ස්ථාපනය කර නිබුණි. පෞද්ගලික ඉඩම්වල ඉදිකර තිබුණු පොදු පහසුකම් මධ්‍යස්ථාන 2 න් එක් ඉඩමක හිමිකාරිය විසින් සෞභාග්‍යා බිම්මල් සඳහා ඉදි කළ මෙම පොදු ගෘහය තුළ මේ දක්වා කිසිදු ප්‍රතිලාභියෙකු බිම්මල් කර්මාන්තයේ නිරත නොවන බැවින් හා ඇය ද බිම්මල් නිෂ්පාදනය නොකරන බැවින් එම පොදු ගෘහය තම ඉඩමෙන් ඉවත් කර ගැනීමට කටයුතු කරන ලෙය 2024 මාර්තු මස 05 වන දින ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිතව දන්වා නිබුණි. ඒ අනුව මෙම පොදු පහසුකම් මධ්‍යස්ථාන හා ඒ සඳහා සපයා දී නිබුණු යන්ත්‍ර හා උපකරණද ආරම්භක අවස්ථාවේ සිට 2024 නොවැම්බර් වන විටත් උෂ්ණ උපයෝජිතව පැවති අතර උක්ත ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම, නිර්දේශ කිරීම, අනුමත කිරීම සිදු කිරීමේ දී අදාළ ව්‍යාපෘතියේ එනම්, පොදු මධ්‍යස්ථානවල අවශ්‍යතාවය හා උපයෝජනය පිළිබඳ නිසි අධ්‍යයනයක් සිදු කර ඒ අනුව ව්‍යාපෘති සැලසුම් සකස් කර නොතිබුණි

(ඇ) හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2021 යටතේ එළවළු, පලතුරු හා කොළ වර්ග විජලනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සෞභාග්‍යා සමිතියට එකතුව රු.5,845,504 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ ද, සමිතියේ සාමාජිකයින්ට තනි පුද්ගල ප්‍රදාන ලෙස එකතුව රු.614,240 ක උපකරණ ද ලබාදී නිබුණි. උක්ත ව්‍යාපෘතිය යටතේ ආහාර ද්‍රව්‍ය විජලනය කරනු ලබන ප්‍රධාන සැකසුම් මධ්‍යස්ථානය පෞද්ගලික ඉඩමක ස්ථාපනය කර තිබූ අතර එහි ඉහත යන්ත්‍ර හා උපකරණ ගිවිසුම්ගතවීමකින් තොරව ස්ථාපිත කර නිබුණි. ලබාදී නිබූ

උපදෙස් මාලාවට අනුව පෙදේගලික ගොඩනැගිලිවල පොදු මධ්‍යස්ථාන පිහිටුවීමට අදාළ කටයුතු කර ඇති අවස්ථා වල දී පොදු ස්ථානයක් සකස් කර ගන්නා තෙක් විධිමත් නීතියානුකූල ක්‍රමවේදයක් හරහා ප්‍රාදේශීය ලේකම් හා අදාළ ඉඩමේ හිමිකරු සමඟ එකඟතාවයක් ඇති කර ගැනීම සිදු කළ යුතු වුව ද ඒ සඳහා එවැනි විධිමත් නීතියානුකූල ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. පුද්ගලික යන්නම් නාමයක් යටතේ මෙහි නිෂ්පාදන ලේබල් කර තිබූ අතර 2021 වර්ෂයේ ආහාර විජලන සමිතියේ ආරම්භක රැස්වීම් වාර්තාවලට අනුව යන්ත්‍ර ක්ෂය සඳහා මෙන්ම යන්ත්‍ර නඩත්තු කිරීම් සඳහා වෙන්කිරීමක් මාසික පදනමට සිදු කළ යුතු බව සහ එකී වෙන් කිරීම් සමිතිය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමකට බැර කළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවද, අදාල සමිතිය වෙතුවෙන් සංවර්ධන දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් ආරම්භ කර තිබුණේ 2023 අප්‍රේල් 20 දින වූ අතර, එදින රු.1,000 ක පමණක් තැන්පත් කර තිබුණි. 2023 නොවැම්බර් 15 දින හොරණ ප්‍රාදේශීය ලේකම් සහ සමිතියේ සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් පැවති රැස්වීමේ දී ව්‍යාපෘතියේ ලාභයෙන් කොටසක් සමග මාසික සාමාජික මුදල් ගිණුමට බැර කළ යුතු බවට ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දුන්න ද ලාභයෙන් යම් වෙන් කිරීමක් සිදු කළ නොහැකි බවට සමිතියේ සභාපති විසින් දැනුම් දී තිබුණි. එම නියා ලාභ ලබන මට්ටමට පැමිණෙන තෙක් මාසිකව රු.2,000 ක මුදලක් සහ රු.100 ක මාසික සාමාජික මුදලක් ද අය කිරීමට එකඟ වී තිබුණ ද 2023 නොවැම්බර් මස සිට 2024 ඔක්තෝබර් වන විටත් එක් වතාවක් පමණක් එලෙස මුදල් තැන්පත් කර තිබුණි. එමෙන්ම මාසික සාමාජික මුදලක් අයකර තැන්පත් කිරීමට එකඟ වුවද එලෙස කටයුතු කර නොතිබුණු අතරම දැනට අලෙවිකරණ කටයුතු සිදුකරන්නේ සභාපති විසින් පමණක් වන බැවින් අලෙවිකරණ කටයුතු සඳහා සම්බන්ධ වන ලෙසට සාමාජිකයන්ගෙන් දිගින් දිගටම ඉල්ලා සිටියද ඔවුන් නවමත් ඒ සඳහා සම්බන්ධ නොවන අතර ඉබේ හටගන්නා කොස්, කොහිල ආදිය පමණක් සැපයීමට අමතරව ව්‍යාපෘතියට අවශ්‍ය පළා වර්ග වගා කරන ලෙසට දිගින් දිගටම සාමාජිකයින් වෙත දැනුම් දුන්න ද එහි සතුටුදායක ප්‍රතිඵලයක් ලැබී නොතිබුණි. ව්‍යාපෘතියේ යන්ත්‍ර උපරිම ලෙස භාවිතා නොකරන අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමටද නොහැකිව තිබුණි.

(ඇ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබූ මණ්ඩගල කුරුඳු ගම්මාන ව්‍යාපෘතිය සඳහා කුරුඳු නිස්සාරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා සහ ප්‍රතිලාභීන් 60 දෙනෙකු සඳහා කුරුඳු පැළ හා කුරුඳු උපකරණ ලබාදීම් වෙනුවෙන් රු.4,869,111 ක මුදලක් වැයකර තිබුණි. මෙහි ව්‍යාපෘති යෝජනාවට අනුව කුරුඳු නිස්සාරණ මධ්‍යස්ථානයේ අපේක්ෂිත නිෂ්පාදිතය ලෙස කුරුඳු කොළ හා පොතු භාවිතයෙන් තෙල් නිෂ්පාදනය පිළිවෙලින් මාසිකව බෝතල් 15 ක් හා 12 ක් ද වශයෙන් දක්වා තිබුණද මෙම කුරුඳු නිෂ්පාදන මධ්‍යස්ථානය ආරම්භ කර වසර 02 කට ආසන්න කාලයක් ගතවී තිබුණද මේ දක්වා නිෂ්පාදනය කර තිබුණේ කුරුඳු තෙල් බෝතල් 27 ක් පමණක් විය. තවද මෙම කුරුඳු තෙල් නිස්සාරණ මධ්‍යස්ථානයේ නිෂ්පාදන කටයුතු 2024 පෙබරවාරි 10 දිනෙන් පසුව සිදුකර නොතිබුණු අතර 2024 මැයි වන විට වර්ෂ 3 කට ආසන්න කාලයක් ගතවී තිබුණ ද මණ්ඩගල කුරුඳු සෞභාග්‍ය නිෂ්පාදන සමිතිය වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි. ඒ අනුව

ලියාපදිංචිය නොමැති සමිතියක් වෙත රු.1,715,000 ක් වටිනා කුරුදු නිස්සාරණ කිරීමේ උපකරණ හා රු.1,674,311 ක් වටිනා ගොඩනැගිල්ල පරිහරණය කිරීමේ අයිතිය ද ලබාදී තිබුණි.

(ඉ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබූ දේශීය වේළඳ පොළට් අතිරේකව අපනයන වෙළඳ පොළ ඉලක්ක කර ප්‍රදේශයේ බුලත් වගාව ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේදී රු.7,356,259 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය මඟින් මාසිකව තනි කණු ක්‍රමය යටතේ බුලත් අත් 938 ක් හා පාත්ති ක්‍රමය යටතේ බුලත් අත් 3600 ක් වශයෙන් මාසිකව බුලත් අත් 4538 ක් නිපදවීමට අපේක්ෂා කර තිබුණ ද ව්‍යාපෘති ප්‍රගති වාර්තාවලට අනුව ප්‍රතිලාභීන් 89 දෙනා අතරින් ප්‍රතිලාභීන් 28 දෙනෙකු පමණක් බුලත් වගාවේ නිරතව සිටියද, එම ප්‍රතිලාභීන්ගෙන් නිදෙනෙකුගේ හැර අනෙක් සියළු ප්‍රතිලාභීන්ගේ අදායම් රු.10,000 ට අඩු මට්ටමක පැවතුණි. එමෙන්ම ව්‍යාපෘතියේ ආරම්භක ප්‍රතිලාභීන් 89 න් 61 ක්ම ව්‍යාපෘති අරමුණෙන් බැහැරව වෙනත් බෝග වර්ග වගා කිරීමට යොමුවී තිබුණි.

(ඊ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2021 යටතේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී දැනට භාවිතයට නොගන්නා වියලන යන්ත්‍ර 02 ක් බෙරුවල ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත බෙරුවල විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ලබා දීමට ඉල්ලුම් කර තිබුණි. ඒ සඳහා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සහ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් නිර්දේශ ලබා දී තිබුණි. මෙම යන්ත්‍ර 02 විසීමන් පරිදි ලබා ගැනීමට හා බෙරුවල විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමැතිය ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලෙස කළුතර දිස්ත්‍රික් ලේකම් විසින් ද බෙරුවල ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා තිබුණ ද බෙරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2024 ජූලි 16 දින පැවති සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාවලට අනුව මෙම වියලන යන්ත්‍ර මෙතෙක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන- (2021) යටතේ මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් "ලාක්ෂ්‍යා" සෞභාග්‍යා සමිතිය වෙත වටිනාකම් රු.150,000 ක් වූ විජලන යන්ත්‍රයක් ලබා දී තිබූ අතර, එය ලබා දුන් දිනයේ සිට වසර 2½ ක පමණ කාලයක් ප්‍රමාණවත් උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් ප්‍රදේශයේ කාන්තා සමිතියක ඉල්ලීම පරිදි 2024 ජූලි 15 වන දින එම සමිතියට ලබා දී තිබුණි. එසේ වුවද එම සමිතිය මඟින් ද යන්ත්‍රයේ පැවති දෝෂ හේතුවෙන් එය භාවිතයට නොගන්නා බවද ඒ අනුව විජලන යන්ත්‍රය ලබාදීමේ අරමුණු වූ විජලන නාක්ෂණය උපයෝගී කරගෙන ආහාර කල් තබා ගැනීම තුළින් සාමාජිකයින්ගේ ආර්ථිකය සවිමත් කිරීම සඳහා දායක වීමට නොහැකි වී තිබුණි. අවශ්‍යතාවය පිළිබඳ නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සිදු කරනු ලැබූ මිල දී ගැනීම නිසා මෙලෙස ව්‍යාපෘතිය යටතේ දරනු ලැබූ වියදම් නිෂ්කාර්ය වී තිබුණි.

(උ) කඳුකර දශකය 2024 – 2033 දශවිධ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ බෙරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කල ගෘහාශ්‍රිත එළුවන් ඇති කිරීමේ වැඩසටහන මඟ ප්‍රතිලාභීන් 05 දෙනෙකු වෙනුවෙන් ගෘහාශ්‍රිත එළුවන් 15 දෙනෙකු ලබාදීම වෙනුවෙන් රු.375,000 වැයකර නිබුණි. එක් ප්‍රතිලාභියෙකු වෙත ලබා දී තිබුණු එළුවන් 03 දෙනෙකු අතරින් පළ අවස්ථාවේ බිහිකළ පැටවුන් අංග විකලව බිහිවී නිබුණු අතර, ඉතා කෙටි කලක් තුළ මිය ගෙ නිබුණි. දෙවන අවස්ථාවේ බිහි කළ පැටවුන් ද එරින් වර රෝගාබාධයන්ට ගොදුරු වී නිබුණි. තව ප්‍රතිලාභියෙකු සඳහා යතුන් 03 දෙනෙකු ලබා දී තිබුණු අතර, අවස්ථා 02 ක දී පැටවුන් බිහිකර නිබු නමුත් ඉන් පළමු අවස්ථාවේ බිහිකරන ලද පැටවුන් දෙදෙනාම මියගොස් නිබුණි. තව ප්‍රතිලාභියෙකුට ලබා දී තිබුණු යතුන් 03 නිදෙනාම ප්‍රතිලාභියා විසින් වෙනත් පුද්ගලයෙකු වෙ ලබාදී නිබුණ ද මේ සඳහා ලබාදුන් නිර්දේශ හෝ අනුමැතීන් ද විගණනයට ඉදිරිපත් කර නොතිබු මෙම යතුන් මිල දී ගැනීමේ දී, පශු වෛද්‍ය නිලධාරීන්ගේ නිර්දේශ යටතව සුදුසු එළුවන් ල ගැනීමට කටයුතු කළ යුතු බව දක්වා නිබුණු අතර, යතුන් ලබාගැනීම සම්බන්ධ සියලු කටයුතු ප වෛද්‍ය නිලධාරීන්ගේ අධීක්ෂණය හා නිර්දේශ මත සිදුවිය යුතු බව දක්වා නිබුණ ද ප්‍රතිලාභියාගෙ විමසීම් සිදු කිරීමේ දී එම යතුන්ගේ නිරෝගී බව පිළිබඳව ගැටළුකාරී තත්ත්වයන් පැන නැඟී නිබුණි

(එ) උක්ත ව්‍යාපෘතිය යටතේම මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විසින් පශු වෛද්‍ය නිලධාරී නිර්දේශය මත 2024 වර්ෂයේදී ප්‍රතිලාභීන් 04 දෙනෙකු වෙත රු.340,000 ක ප්‍රතිපාදන ලබා දී අතර මිලදී ගත් එක් ගැහැණු යතෙකු 2025 පෙබරවාරි 07 වන දින පැටවුන් බිහි කිරීමෙන් පසු අය වූවද නියමිත අවස්ථාවෙදීවීම පශු වෛද්‍ය ප්‍රතිකාර ලබා නොදීම හේතුවෙන් 2025 පෙබරවාරි 13 දින මිය ගොස් නිබුණි. එසේ වුවද විගණිත දිනය වූ 2025 පෙබරවාරි 21 දින වන විට ද මියගිය එළ වෙනුවෙන් උපදෙස් ප්‍රකාරව රක්ෂණ වන්දි ලබා ගැනීමට කටයුතු කර නොනිබුණු අතරම සත් නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2024 අගෝස්තු 10 වන දින නිකුත් කරන දෙපාර්තමේන්තු චක්‍රලේඛ 08/2024 ප්‍රකාරව යන්ත්‍ර පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රදේ රජයේ පශු වෛද්‍ය නිලධාරියාගේ නිර්දේශ ලබා ගැනීම හා පශු වෛද්‍ය නිලධාරියාගේ අධීක්ෂ යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය පෙන්වා දී නිබුණ ද එම අධීක්ෂණය නිසි ලෙස නොනිබුණු අතර ඒ පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ද ප්‍රමාණවත් සම්බන්ධීකරණ සිදුවී නොනිබුණි.

(ඒ) උක්ත වැඩසටහන යටතේ මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය ජනතාවගේ ආර්ථි ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක කර නිබූ තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා කු පැටවුන් ලබාදීමේ ව්‍යාපෘති 02 ක් සඳහා රු.594,000 ක් වැයකර නිබුණු අතර 2025 පෙබරවාරි මස දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේ දී ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇති කුකුළු පැටවුන් 800 න් 13 ප්‍රමාණයක් මිය ගොස් නිබූ අතර, එය ලබාදුන් කුකුළු පැටවුන් සංඛ්‍යාවෙන් සියයට 17 ක ප්‍රමාණ විය. මේ අතුරින් ප්‍රතිලාභීන් දෙදෙනෙකු වෙත ලබා දී නිබූ කුකුළු පැටවුන් 20 දෙනෙකුගෙන් සි පැටවුන් මිය ගොස් නිබුණි. එමෙන්ම ප්‍රතිලාභීන්ට කුකුළු පැටවුන් ලබා දීමේ දී වයස මාස

වයසැති පැටවුන් ලබා දී නිබූ අතර, විගණිත දිනය වූ 2025 පෙබරවාරි 06 දින වන විට කුකුළු පැටවුන්ගේ වයස මාස 06 ඉක්මවා ගොස් නිබුණ ද ප්‍රතිලාභීන් 24 දෙනෙකුට ලබා දුන් කුකුළු පැටවුන්ගෙන් මියගිය සතුන් හැර ඉතිරි සතුන්ගෙන් 199 දෙනෙකු මෙතෙක් බිත්තර නොදමන බව ද වැඩිදුරටත් නිරීක්ෂණය වූ අතර, ඒය මෙම ව්‍යාපෘතිය යටතේ ලබාදුන් කුකුළු පැටවුන්ගෙන් සියයට 25 ක් විය. ඒ අනුව එම ව්‍යාපෘතියේ අරමුණු වූ "අඹූ ආදායමලාභී ග්‍රාමීය ජනාතාවගේ ආර්ථිකය ඉහළ නැංවීමට ප්‍රමාණවත් දායකත්වයක් ලබාගැනීම" යන්න අපේක්ෂිත මට්ටමින් ඉටු වී නොනිබුණි.

(ඇ) කඳුකර දශකය 2024 – 2033 දශවිධ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ලද රු.මිලියන 02 ක ප්‍රතිපාදන යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකර නිබුණු පැලවත්ත පිටිගල මාර්ගයේ මිරිස්වත්ත දක්වා කොටයේ හමුදා කඳවුර සඳහා ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සකස් කර නිබූ රු.මිලියන 2 ක් වූ ඇස්තමේන්තුව අනුව මාර්ගයේ උපරිම දිග ආසන්න වශයෙන් මීටර් 300 ක් සහ උපරිම පළල මීටර් 4.5 ක් ලෙස දක්වා නිබුණ ද ඒ සඳහා ලබාගත් ස්ථානීය මිනුම් විගණනයට ඉදිරිපත් කර නොනිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා වූ අනුමත කළ මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තාවට අනුව යෝජිත ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන පුද්ගලයන් සංඛ්‍යාව 95 ක් ලෙස ද පවුල් සංඛ්‍යාව 25 ක් ලෙස ද දක්වා නිබූ අතර, ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය ප්‍රජාවට සැලසෙන ප්‍රතිලාභ ලෙස ආර්ථික කටයුතු වැඩි දියුණු කර ගැනීම, ගමනාගමනයට පහසුකම් සලසා දීම, කෘෂිකාර්මික අධ්‍යාපන කටයුතු වැඩි දියුණු කිරීම හා යුධ හමුදා කඳවුරේ සියළුම නිලධාරීන්ට ප්‍රතිලාභ ලැබීම වශයෙන් දක්වා නිබුණ ද විගණනය විසින් 2025 ජනවාරි 15 දින අදාළ මාර්ග ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ ස්ථානීය භෞතික පරීක්ෂාවේ දී අදාළ ව්‍යාපෘතියේ මාර්ග සංවර්ධන කටයුතු 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සුරෝගාමී බලකායේ පැලවත්ත හමුදා කඳවුරේ අභ්‍යන්තර මාර්ග සංවර්ධන කටයුතුවලට පමණක් සීමා වී නිබුණි. ඒ අනුව මාර්ග සංවර්ධනය පැලවත්ත යුධ හමුදා කඳවුර අභ්‍යන්තරයේ දිග මීටර් 100 ක මාර්ග කොටසක් සම්පූර්ණයෙන් අලුතින් ඉදිකිරීමට සහ පොදු නිලධාරී නිවාස්නය දක්වා වූ දිග මීටර් 84 ක නවීන් කොටසක මාර්ග අලුත්වැඩියාව සිදුකිරීමට පමණක් සීමා වී නිබුණි. මෙයේ යුධ හමුදා කඳවුර පිවිසුම් මාවත අලුත්වැඩියාව සඳහා ලද රු.මිලියන 02 ක ප්‍රතිපාදන මගින් ප්‍රාදේශවාසීන් විසින් ඉල්ලුම් කළ ප්‍රවේශ මාර්ගය වෙනුවට හමුදා කඳවුර අභ්‍යන්තර මාර්ග පමණක් සංවර්ධනය කිරීම වෙනුවෙන් 2025 දෙසැම්බර් 15 දින අදාළ කොන්ත්‍රාත්කරුට රු.1,114,510 ක් ගෙවා නිබූ අතර, ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය සඳහා ලද සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම පරිදි අත්‍යාවශ්‍ය මාර්ග සංවර්ධනය කරනු වෙනුවට ආරක්ෂක අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ අලුත්වැඩියා කරගත හැකිව නිබූ හමුදා කඳවුරු අභ්‍යන්තර මාර්ග පමණක් සංවර්ධනය කර තිබීම තුළින් ප්‍රදේශවාසීන් සඳහා ප්‍රතිලාභ නොලැබීමේ තත්ත්වයක් උද්ගත වී නිබුණි. ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ලද සම්පූර්ණ ප්‍රතිපාදනයම ඒ සඳහා භාවිතා කළ නොහැකි වී නිබීමෙන් ද ප්‍රදේශවාසීන් සඳහා සම්පූර්ණ ප්‍රතිලාභ නොලැබීමේ තත්ත්වයක්ද දක්නට ලැබුණි.

4.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචන වර්ෂය තුලදී කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි පිටියුම් අභියස ප්‍රධාන විදුලි පුවරුවෙහි සිදු වූ හදිසි ගිනි ගැනීම් හේතුවෙන් ගොඩනැගිල්ලේ කොටස්වලට හා ප්‍රධාන විදුලි පුවරුව ආශ්‍රිතව සම්පූර්ණයෙන්ම හානියට පත්වීම් නිසා සිදු වූ සම්පූර්ණ හානියේ විටිනාකම් රු. 7,500,000 ක් පමණ වන බවට ඇස්තමේන්තු කර තිබුණු අතර මු.රෙ. 104 (4) වාර්තාවට අනුව හානියට වගකිවයුතු පාර්ශවය ලෙස ලංකා විදුලි (පෞද්ගලික) සමාගම් නිරණය කර ඒ බව ඔවුන් වෙත දැනුම් දී තිබුණි. එසේ වුවද ගිනි ගැනීමට හේතුව ලෙසට විමර්ශන මගින් හෙලිදරව් කර තිබුණු Bus-bar පැනලය නම් සමාගම් යතු වූවක් නොවන බවට එම සමාගම් පවසා තිබූ අතර හානි ප්‍රතිපූර්ණය සම්බන්ධයෙන් කිසිදු එකඟතාවයක් ද දක්වා නොතිබුණි. එමෙන්ම අදාළ ගිනි ගැනීම් සිදු වී මෙම වාර්තාවේ දින වන විට මාස 08 කට අධික කාලයක් ගත වී තිබුණ ද දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ලේ හානියට පත් විදුලි සැපයුම් ස්ථාවරව යළි ලබා ගැනීමට හෝ එක් මහල කාලසීමාවකට පමණක් යෝග්‍ය වන පරිදි තාවකාලිකව ලබා දුන් විදුලි සැපයුම් යථාවත් කිරීමට නොහැකිව තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ, වංචනික කටයුතු හෝ වෙනත් කරුණු මත කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක විශ්‍රාමිකයන් 71 දෙනෙකු වෙනුවෙන් වැඩිපුර ගෙවා තිබූ මුදල් රු.13,147,662 ක් විය.

(ඇ) බෙරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු අංක WPPD -2972 දරන් කැබ් රථය 2025 මාර්තු මස 12 දින බෙරුවලට ආසන්න ප්‍රදේශයක දී දුම්රියේ ගැටීමෙන් අනතුරට ලක්ව තිබුණි. එසේ වුවද අනතුර සිදු වී විගණිත දිනවූ 2025 අප්‍රේල් මස 01 දිනට දින 19 ක් ගත වී තිබුණ ද මේ සම්බන්ධයෙන් මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩලයක් පත්කර පරීක්ෂණ ආරම්භ කර නොතිබුණු අතරම මු.රෙ 1646 ප්‍රකාර අනතුර සම්බන්ධ පොලිස් වාර්තාව ද ඉදිරිපත් කර නොතිබුණි.

4.4 අනාර්ථික ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බෙරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන රු.500,000 ක් යොදවන්ගම ප්‍රජාශාලාවේ වර්ග අඩි 500 කට ආසන්න ප්‍රමාණයක් කොන්ක්‍රීට් යෙදීම, ඇතුළත බිත්ති පිටත නිත්න ආලේප කිරීම, දොර ජනේල අලුත්වැඩියාව, ජනෙල් සඳහා උළුවහු යෙදීම් ආදී ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර තිබූ අතර මෙලෙස රජයේ ප්‍රතිපාදන යොදා අලුත්වැඩියා කරන ලද ප්‍රජා ශාලාවේ වහල අධික ලෙස දිරා ගොස් කඩා වැටීමට ආසන්නව පැවතුණි. මෙලෙස අලුත්වැඩියාවට ලක් කරන ලද ගොඩනැගිල්ල සහ භූමියේ නිරවුල් අයිතිය පවා පැහැදිලි නොවන බවත් හඳුනාගෙන නොතිබුණු අතර එලෙස අයිතිය පවා හඳුනාගෙන නොමැති වහලය කඩා වැටීම්

ආයන්න ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කිරීම සඳහා රජයේ අරමුදල් යොදවා නිබුණි. ඉහත තත්ත්වයන් ප්‍රදේශයේ සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරී පවා ලිඛිතව පෙන්වා දී නිබූ තත්ත්වයක් තුල මේ සඳහා අරමුදල් යෙදවීමට අනුමැතිය ලබා දී නිබුණු අතර මෙම ගොඩනැගිල්ල සහිත භූමිය ද අධික ලෙස වල් බිහිවී ඇත උපයෝජිතව පැවතුණි.

(ආ) 2014 වර්ෂයේ පළාත් නැගුම සංවර්ධන වැඩසටහන යටතේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදලින් රු.7,500,000 ක් හොරණ රාජ්‍ය ඔසු සල ඉදිකිරීම සඳහා වෙන්කර එම ගොඩනැගිල්ල 2016 වර්ෂයේ දී රු.7,075,000 ක ඇස්තමේන්තු පිරිවැයකින් ඉදිකිරීම් නිම කළ ද විගණිත දිනය වූ 2024 නොවැම්බර් මස 07 දින වන විටත් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතයකින් තොරව ඇත උපයෝජිතව පැවතුණු අතර, මිහල් දෙකකින් සමන්විත වර්ග අඩි 1500 ක් පමණ වපසරියකින් යුතු ගොඩනැගිල්ලේ පහත මහලේ මේ වන විට ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හා සංවර්ධන නිලධාරී කාර්යාල පමණක් ස්ථාපිත කර නිබුණු අතර මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර ආරම්භයේ දී ව්‍යාපෘතියට සම්බන්ධිත දෙපාර්ශවය විසින් භූමිය නිරීක්ෂණය කර ඉදිකිරීම් සැලැස්ම ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබා දී නිබුණු නමුත් අනුමත කරන ලද සැලැස්ම වෙනස් කර ගොඩනැගිල්ල ඉදිකර ඇති බැවින් ද එය රාජ්‍ය ඔසුසල ශාඛාවන් පවත්වා ගෙන යාමට අවශ්‍ය ප්‍රමිතියට අනුකූල නොවන බැවින් ද මෙම ගොඩනැගිල්ලේ රාජ්‍ය ඔසුසලක් ස්ථාපිත කළ නොහැකි බවට 2024 අප්‍රේල් 29 දින ඖෂධ නීතිගත සංස්ථාව විසින් දක්වා නිබුණි. ඉහත කරුණු සහ දෙපාර්ශවය අතර ඉඩම් පවරා ගැනීම හා ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධව සිදුකළ යුතු නීතිමය අවශ්‍යතා සම්බන්ධව පැවති ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් මේ වන විට ඉදිකිරීම් අවසන් කර වසර 08 ක් පමණ කාලයක් ගතවී නිබුණ ද මෙම ගොඩනැගිල්ල ඇත උපයෝජිතව පැවති අතරම නිසි උපයෝජනයක් හා නඩත්තුවක් නොමැතිවීම හේතුවෙන් දිනෙන් දින විනාශවීමයට පත්වෙමින් නිබුණි.

(ඇ) ජනාධිපති කාර්යාල වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර 2018 හා 2019 වර්ෂවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක් තුළින් ක්‍රියාත්මක කර නිබුණු දිළිඳුකම් තුරන් කිරීමේ පරමාර්ථය පෙරදැරි කරගත් ග්‍රාම ශක්ති ජනතා වැඩසටහන යටතේ නියැදි පරීක්ෂාවට ලක් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක අදියර දෙකක් යටතේ සමිති 57 ක් ලියාපදිංචි කර නිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට ඉන් සමිති 45 ක් එනම් සියයට 79 ක්ම අක්‍රීයව පැවති බැවින් එදිනට එම සමිති වල බැංකු ගිණුම්වල ශේෂව පැවති රු.21,821,998 ක මුදලක් ඇත උපයෝජිතව පැවතුණි. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක එකී ක්‍රියාකාරීව පැවති සමිතිවල සාමාජිකයින් හට ලබා දී නිබූ ස්වයංරැකියා ණය අතරින් රු.1,566,845 ක්ද 2024 දෙසැම්බර් 31 දිනට අය නොවූ අක්‍රිය ණය වශයෙන් පැවතුණි. චක්‍රලේඛ ප්‍රකාරව සක්‍රීය මට්ටමේ පවතින ග්‍රාම ශක්ති සමිතිවල ව්‍යවස්ථාවට අනුව විධායක සභාව කැඳවා අදාළ වසම් භාර සංවර්ධන නිලධාරීගේ සම්බන්ධීකරණයෙන් ප්‍රජා සංවර්ධන කටයුතු ආරම්භ කළ යුතු බව දක්වා නිබුණ ද ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොනිබුණු අතර එම චක්‍රලේඛය මගින් සඳහන් කර ඇති හැකියා හා ආකල්ප වර්ධන පුහුණු හා කුසලතා වර්ධන

වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රජා සංවර්ධන ක්‍රියාවලිය තුල හෙතෙක යටිතල පහසුකම් දියුණු කිරීමට යාපේක්ෂව ප්‍රජාවගේ ආකල්ප, කුසලතා හා හැකියාවන් ගොඩනැගීම සඳහා නිබෙන කාලීන සමාජ අධ්‍යතාවය අවධාරණය කර නිබුණ ද ඒ සඳහා වූ ක්‍රියාමාර්ග සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට ද වගකිව යුත්තන් කටයුතු කර නොනිබුණි. දෙවැනි අදියර ග්‍රාම ශක්ති සමිති සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන වැය කිරීම පිළිබඳ වූ චක්‍රලේඛයට අනුව අක්‍රීය මට්ටමේ පවතින ග්‍රාම ශක්ති සමිතිවල ප්‍රතිපාදන මුදල් සක්‍රීය මට්ටමේ පවතින සමිතිවලට ලබාදීමට කටයුතු කල යුතු වුවද කාලීනව ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොනිබුණි.

(ඇ) කළුතර දිස්ත්‍රික්කය තුළ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බොහොමයක අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සංවර්ධන නිලධාරීන් සේවයේ යොදවා සිටි අතර නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 පමණක් එලෙස අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවයේ යොදවා සිටි අතිරික්ත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 80 දෙනෙකු විය.

4.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 28 ක් සඳහා 2025 අප්‍රේල් වන විට පිළිතුරු එවා නොනිබුණු අතර, මාස 03 කට වැඩි කාලයක් ගත වුව ද පිළිතුරු ලබා නොදුන් විමසුම් ගණන 12 ක් විය.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2025 ජනවාරි 31 දිනට පිළියෙල කර නිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කර නිබූ ආපදාවලින් විපතට පත් වූවන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ 2024 වර්ෂය තුලදී නෝරාගත් ප්‍රතිලාභීන් අතුරින් ප්‍රතිලාභීන් 07 දෙනෙකු වෙත ලබා දිය යුතු වන්දි ප්‍රතිලාභ මුදල්වල පළමු, දෙවන හා තෙවන වාරිකවලට අදාළව එකතු වටිනාකම රු.2,674,750 ක් වූ චෙක්පත් නිකුත් කර, 2025 පෙබරවාරි 25 විගණන දින වන විට දින 60 ත් දින 84 ත් අතර කාලයක් ගත වී නිබුණ ද, එම චෙක්පත් අදාළ ප්‍රතිලාභීන් වෙත ලබා නොදී විෂය නිලධාරී විසින් අත රඳවාගෙන නිබුණි. තවද මෙම චෙක්පත්වල දිනයන් පිළිබඳව සලකා බැලීමේ දී වලංගු කාලය ද ඉක්ම ගොස් නිබූණි. දෙවන වාරිකය නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදීමට නාක්ෂණ නිලධාරී විසින් ඉඩම යකස් කිරීමේ දී සහ නැනීම කටයුතුවලදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මාර්ගෝපදේශ අනුගමනය කිරීම, ඉඩම / පසෙහි ස්වභාවය, නිවසෙහි සැලැස්ම සලකුණු කර ගැනීම, අත්තිවාරම, වානේ කම්බිවල වට ප්‍රමාණය, පොළොව මට්ටමේ සිට නිම වූ පොළොව දක්වා ඇති දුර, වියුහයේ වැරැද්දක් නොමැති බව, ඉඩමෙහි සහ ද්‍රව්‍යවල ගුණාත්මක බව සහ නියමිත මට්ටම් දක්වා යම්පූර්ණ කර නිබීම යන කරුණු පරීක්ෂා කළ යුතුය. එසේ වුවද ඉහත ප්‍රතිලාභීන් වෙත වාරිකය මුදාහැරීම සඳහා පිළියෙල කර නිබූ චෙක්පත්වල දිනයන් පිළිබඳව සලකා බැලීමේ

මාර්ගෝපදේශයට පටහැනිව යමින් ප්‍රතිලාභීන් වෙත පළමු වාරිකය සඳහා චෙක්පත පිළියෙල කළ දිනයේ දිම දෙවන වාරිකය සඳහා චෙක්පත ද පිළියෙල කර නිබුණි. මූදල් රෙගුලාසි 215(1) ප්‍රකාරව අපේක්ෂිත ඉතුරුවක් කිසියම කාර්යයන යෙදවීමේ අදහසින් කිසිදු හේතුවක් නිසා වුවද නියමිත දිනට කලින් ගෙවීම නොකළ යුතුය. නමුත් ඉහත ගෙවීම් පිළිබඳව සලකා බැලීමේ දී මූදල් රෙගුලාසිවලට ද පටහැනිව කටයුතු කර නිබුණි. උක්ත ව්‍යාපෘතිය යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිවාස ඉදිකිරීම සඳහා ප්‍රතිලාභීන් වෙත ලබා දී නිබූ රජයේ ඉඩම් සංඛ්‍යාව 27 ක් වුවද නිවාස සම්පූර්ණ කර නිබුණේ ප්‍රතිලාභීන් 21 දෙනෙකු පමණක් වූ අතර, ප්‍රතිලාභියා සතු ඉඩමක රජයේ ආධාර මත නිවාස ඉදිකිරීම සඳහා ප්‍රතිලාභ ලබා දුන් ප්‍රතිලාභීන් 04 දෙනෙකු අතරින් නිවාස ඉදිකිරීම සම්පූර්ණ කර නිබුණේ 02 දෙනෙකු විසින් පමණි. මෙම ව්‍යාපෘතිය සඳහා ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබා දිය යුතු රජයේ ඉඩම් සංඛ්‍යාව 44 ක් වුව ද 2024 ජූලි 31 දින වන විට ලබා දී නිබුණේ ඉඩම් 28 ක් පමණක් වූ අතර, නිවාස ඉදිකර අවසන් කර නිබුණේ ප්‍රතිලාභීන් 16 දෙනෙකු පමණි.

(ආ) උක්ත වැඩසටහන යටතේ නියැදි පරීක්ෂාවට ලක් වූ අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 15 දෙනෙකු වෙත නිකුත් කළ යුතු එකතුව රු.375,000 ක රුදවුම් මූදල් ප්‍රතිලාභීන් වෙත නිකුත් නොකර වසර 01 ත් වසර 06 ත් අතර කාලයක් දක්වා රදවා නබාගෙන නිබූ අතර, මිතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 14 දෙනෙකු වෙත ගෙවිය යුතු එකතුව රු.350,000 ක රුදවුම් මූදල් මාස 04 ත් මාස 28 ත් අතර කාලයක් දක්වා පොදු තැන්පත් ගිණුමේ රදවා නබාගෙන නිබුණි. තවත් ප්‍රතිලාභීන් 07 දෙනෙකු වෙත නිදහස් කළ යුතු වූ රු. 175,000 ක රුදවුම් මූදල් හා එක් ප්‍රතිලාභියෙකු වෙත ලබා දිය යුතු වූ රු.200,000 ක ආධාර මූදල් ද වශයෙන් එකතුව රු.375,000 ක මූදලක් ප්‍රතිලාභීන් වෙත ලබා දීමෙන් තොරව රජයේ ආදායමට බැර කර නිබුණි. ඒ අනුව මෙ වෙනුවෙන් නිකුත් කර නිබුණු චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූලික නිවසෙහි ඉදිකිරීම් සම්පූර්ණ කළ පසු ඉදිකිරීම් කටයුතු උසස් තත්ත්වයෙන් නිම කෝට ඇති බවට තහවුරු කරමින් තාක්ෂණික නිලධාරි විසින් අනුකූලතා/ යෝග්‍යතා සහතිකය නිකුත් කලයුතු නමුත් ඉහත ප්‍රතිලාභීන්ගේ නිවාස ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වගකිව යුතු නිලධාරීන් විසින් ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් හා මෙහෙයවීමක් එය අවශ්‍ය අවස්ථාවල දී සිදුකර නොතිබීම හේතුවෙන් එම ඉදිකිරීම් කටයුතු අධික්ෂණය කර ඉදිකිරීම්වල අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන අනුකූල සහතික ලබා දී අදාල ව්‍යාපෘතියේ අරමුණු අපේක්ෂිත මට්ටමට ලභාකර ගත නොහැකිවී නිබුණි.

(ඇ) ආපදාවලින් විපතට පත් ජනතාවට නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ මිතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. 2,975,000 ක මූදල් ආධාර ලබා දී නැවත පදිංචි කරන ලද නිවාස 02 ක් ප්‍රතිලාභීන් විසින් අත්සතු කර නිබුණ ද මෙම ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දිස්ත්‍රික් ලේකම් වෙතින් උපදෙස් ඉල්ලීම් හැර 2025 පෙබරවාරි 07 වන දින වන විටත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක පි
කල නියැදි විගණන පරීක්ෂාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 හි 2024 වර්ෂයේ දී නාවකාලි
ගොනු 79 ක් මත රු.12,279,674 ක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා නිබුණු අතර බෙරුවල ප්‍රාදේ
ලේකම් කාර්යාලය විසින් කිසිදු ගොනුවක් නොමැතිව විශ්‍රාමිකයන් 20 දෙනෙකු සඳහා විශ්‍රාම වැටු
වශයෙන් රු.3,978, 836 ක් ගෙවා නිබුණි. අස්ථානගත වූ ගොනු අස්ථානගත වූයේ කවදා ද, කුම
නිලධාරියෙකු භාරයේ නිබියදී ද යනවග හා ඒවා අස්ථානගත වීමට හේතුව අනාවරණය කරගෙ
නොනිබුණු අතර පවින්වාගෙන යනු ලබන විශ්‍රාම වැටුප් ගෙවීම් අංශයේ විශ්‍රාම වැටුප් ගොනු , මියයා
හෝ වෙනත් හේතු මත වෙනස් වන ගොනු, නව එකතු කිරීම් වන ගොනු ආදියට අදාළ තොරතු
විශ්‍රාම ගොනු සම්බන්ධ ලේඛනයට ඇතුළත් කර එම ගොනු විශ්‍රාම වැටුප් නිලධාරීන්ට භාරදීමේ පැ
නිලධාරීන් විශ්‍රාම යාම් හෝ ස්ථාන මාරු වී යන අවස්ථාවල දී නිලධාරීන් භාරයේ පවතින ගොනු
විසින් පරීදි භාරදීම් හා භාර ගැනීම් කිසිදු අවස්ථාවක සිදුවී නොනිබුණි. එම හේතුවෙන් ගොනු
අස්ථානගත වීම්, ප්‍රමාණවත් ලේඛන ගොනුගත නොවීම්, සම්බන්ධ වගකිව යුතු නිලධාරීන් කවුරුන්ද
යන්න තහවුරුවට නිසි ක්‍රමවේදයක් ස්ථාපනය වී නොනිබීම නිසා විශ්‍රාම ගොනු හා ලේඛන නඩත්තු
සම්බන්ධයෙන් ප්‍රමාණවත් වෘත්තිය සැලකිල්ලකින් කටයුතු කර නොනිබුණු බව නිරීක්ෂණය කෙරේ

(ඉ) ගණනය කිරීමේ දෝෂ හෝ වෙනත් කරුණු මත කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යා
08 ක විශ්‍රාම ලිපිගොනු 71 ක 2024 දෙසැම්බර් 31 දිනට වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් මු
රු.13,147,662 ක් වූ අතර ඒවා වාරික වශයෙන් අය කර ගනිමින් පැවතුණි. ඒ අතරින් ප්‍රාදේ
ලේකම් කාර්යාල 3 ක විශ්‍රාමිකයන් 07 දෙනෙකු මියයාම් හේතුවෙන් රු.313,044 ක් අය හෙ
පැවතුණි.

(ඊ) ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම් සඳහා 2023 සහ 2024 වර්ෂවලදී වගාවට සුදුසු රජයේ ඉඩම් හා උ
උපයෝජිත රජයේ ඉඩම් කෙටිකාලීන බෝග වගාවන් සඳහා යොදා ගැනීමේදී බෙරුවල ප්‍රාදේ
ලේකම් බල ප්‍රදේශයට අයත් රජයේ ඉඩම් 05 ක් කෙටිකාලීන බෝග වගාවන් සඳහා වගාකරුවන්
දෙනෙකු වෙත වාර්ෂික වගා අවසර පත්‍ර 17 ක් යටතේ ලබා දී නිබුණි. මෙම වගා බිම් සම්බන්ධයෙ
විගණනය විසින් සිදුකළ භෞතික පරීක්ෂාවේ දී බොල්ලවිවදෙනිය ඉඩමේ අක්කර 01 ක
ප්‍රමාණයක් කෙසෙල් බෝගය වගා කිරීම් සඳහා වසරක කාලයක් සඳහා වගාකරුවකු වෙත
දී නිබුණු නමුත් ගිවිසුම්ගත කාලසීමාවන් තුළ එම වගාකරු විසින් ගිවිසුමට බැඳී ඇති, කෙ
වගාවට අමතරව පොල් පැළ 50 ක් පමණ සිටුවා නිබුණු අතර ලබා දී ඇති බිම් කොටස ඉක්
හාවිතා කර නිබුණි. කෙටිකාලීන බෝග වගා කිරීම් සඳහා ලබා දී නිබූ මෙම ඉඩම් ස්ථිර ගස් ස
වගාවට සුදුසු නත්වයේ භූමියක් නොවූවද නැවත විරක් වාර්ෂික බදු පදනමෙන් උක්ත වගාකරු
ඉඩම් ලබා දී නිබුණි. අරලියවත්ත ඉඩමෙන් රූඩ් 03 පර්චස් 35 ක ප්‍රමාණයක් පලතුරු වගාව ස
වසරක කාලයකට නවත් වගාකරුවකු වෙත ලබා දී නිබුණ ද අදාළ කාල සීමාව තුල එම වගා
විසින් ඉඩමේ වගා කටයුතු සිදුකර නොනිබුණි. එමෙන්ම මහ පයාගල වසමෙහි නවත් වගාකරු
වෙත මල්ගහවත්ත නැමැති ඉඩම් කෙටිකාලීන බෝග වගාවන් සඳහා වසරක කාලයකට බලපත්‍ර

දී නිබුණද 2024 නොවැම්බර් වන විටත් මෙම වගාකරු විසින් වගා කටයුතු ආරම්භ කර නොනිබුණි. එමෙන්ම වෙරගල වසමෙහි තුරේ වත්න ඉඩම වගාකරුවන් 13 ක් වෙත ලබා දී නිබුණු අතර මෙහි කෙටිකාලීන බෝග වගා කිරීම සඳහා 2024 අප්‍රේල් 30 දින දක්වා අවසර පත්‍ර ලබා දී නිබුණි. එසේ වුවද එම් කාලසීමාව තුල දී වගා කටයුතු සාර්ථකව නිමකර නොනිබුණි. මෙලෙස ශ්‍රී ලංකාව තුළ උද්ගත වෙමින් පවතින ආහාර අර්බුදයට විසඳුමක් ලෙස රජයේ ඉඩම් හා උෂ්ණ උපයෝගීත රජයේ ඉඩම් කෙටිකාලීන බෝග වගාවන් සඳහා සුදුසු වගාකරුවන්ට කඩිනමින් ලබාදීම මගින් රටේ ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම හා සුදුසු වගාකරුවන්ට එමගින් ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට අවස්ථාව සැලසීම මෙම වැඩසටහනේ අරමුණ වුවත් එයට ලභාවීම උදෙසා බෙරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක ආහාර සුරක්ෂිතතා ව්‍යාපෘතින් හි දායකත්වය පහළ මට්ටමක පැවතුණි. තවද චක්‍රලේඛ ප්‍රකාරව වගාකරුවන් සඳහා පහසුකම් සැලසීමක් සිදුකර නොනිබුණු අතරම වගා කිරීමේ කටයුතු සම්බන්ධ ප්‍රමාණවත් පසු විපරමක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකර නොනිබුණි.

(උ) වාණිජ නොවන කාර්යයන් සහ කුඩා ආර්ථික ජීවනෝපාය අවශ්‍යතා සඳහා පස් හෝ බොරළු යන අමුද්‍රව්‍ය කැනීම් ස්ථානයකින් උපරිම කියුබ් 100 නොඉක්මවන ප්‍රමාණයන් යම් ඉඩමකින් ඉවත් කිරීමට යම් අයෙකු ඉල්ලුම් කරන අවස්ථාවක අවශ්‍ය නම් ප්‍රාදේශීය පරිසර කමිටුවේ නිර්දේශය ලබාගැනීමට ප්‍රාදේශීය ලේකම් විසින් ක්‍රියා කළ යුතු අතර 2024 මාර්තු 13 දිනැති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී, ඉංගිරිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති විසින් පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ දී ගන්නා ලද තීරණය පරිදි ඉංගිරිය හා හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ පස් හා වැලි කැණීම් කටයුතු සඳහා බලපත්‍ර ලබාදීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති පරිසර කමිටුවක නිර්දේශ මත අනුමැතිය ලබාදීමට කටයුතු කළ යුතු බව දන්වා නිබුණි. ඒ අනුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත පස් හා වැලි සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශ ඉදිරිපත් කරන අවස්ථාවල දී ප්‍රාදේශීය ලේකම් කාර්යලයේ පිහිටුවා ඇති පරිසර කමිටුවක තීරණය අනුව කටයුතු කර නිර්දේශ ලබා දෙන ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා නිබුණි. එසේ වුවද 2024 සැප්තැම්බර් 12 දක්වා පස් හා වැලි කැණීම් සිදු කිරීම සඳහා අයදුම්පත් 26 ක් ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර නිබුණ ද කිසිදු අවස්ථාවක පරිසර කමිටු වාර්තා ලබාගැනීමක් සිදු කර නොනිබුණි.

(ඌ) අධිකරණ නියෝගයක් මගින් පදිංචි නිවසින් ඉවත් කර සිටි අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 832 බී 'රිදීරේවාගම' වසමෙහි පදිංචිව සිටි පවුලක් 2022 මාර්තු 25 වන දින සිට ඩාර්ටන්ෆිල්ඩහි වසා දමා ඇති දෙමළ පාසල් ගොඩනැගිල්ලට අනවසරයෙන් පැමිණ පදිංචිව සිටි අතර එම ස්ථානයේ අවසරයකින් තොරව සංවර්ධන කටයුතු සිදුකරන බවටත්, ප්‍රාදේශීය ලේකම්ගේ අනුදැනුමකින් තොරව පදිංචිව සිටින ගොඩනැගිල්ලට විදුලිය හා දුරකථන පහසුකම් ද ලබාගෙන ඇති බවත් වාර්තා වී නිබුණු නමුත් මේ සම්බන්ධයෙන් මෙයට වසරකට පමණ පෙර නීතිපතිගෙන් උපදෙස්

ඉල්ලා නිබීම පමණක් සිදුකර නිබුණු නමුත් ද එම පදිංචිකරු ඉන් ඉවත් කිරීමට වසර 03 කටත් අධික කාලයක් නිස්සේ වගඋත්තරකරුවන් විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොනිබුණි. මේ හේතුවෙන් කොට්යාශයට අත්‍යවශ්‍යව පවතින දෙමළ මාධ්‍යයෙන් පෙර පාසලක් මෙම පාසල් ගොඩනැගිල්ල ආරම්භකිරීමට නොහැකිව නිබුණි.

(ඇ) කළුතර දිස්ත්‍රික් විගණන කළමනාකරණ කමිටු රැස්වීම්වල දී පළාත් පාලන ආයතන වලින් පවරා ගත යුතු ඉඩම් හා පළාත් පාලන ආයතන වෙත පැවරිය යුතු ඉඩම් හඳුනා ගෙන නිවරදිව පවරාදීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී නිබුණ ද නියැදි පරීක්ෂාවට ලක් වූ කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් පළාත් පාලන ආයතන වෙත පැවරිය යුතු ඉඩම් කටයුතු සිදු කර නොනිබුණි. එමෙන්ම හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්යාශයේ රජයේ ඉඩම්වල පිහිටි ප්‍රා නිලධාරී වසම 21 න් ඉඩම් 14 කම අදාළ ඉඩම් කොටස් මැන මායිම් සකස් කිරීමට 2025 මැයි වන විටත් කටයුතු කර නොනිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා පවත්නා සේවා සැපයීමේ කොන්ත්‍රාත්තු ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කටයුතු පරීක්ෂාවේදී ගිවිසුම්ගත පරිදි නියමිත ප්‍රමිතීන්ගෙන් යුතුව අදාළ පවත්නා කාර්යයන් ඉටු වී නොනිබුණු අතරම, ඒ සඳහා ඉදිරිපත් කළ යුතු මාසික ඉන්වොයිස් පත් සහ ඉදිරිපත් කළ යුතු සේවක අර්ථ සාධක අරමුදල් බැර කිරීම් අංක අතුළත් වාර්තා ද ඉදිරිපත් නොනිබුණු අවස්ථා මෙන්ම ඉදිරිපත් කර නිබුණු වාර්තා ද නිවැරදි නොවන අවස්ථාවන් පැවතුණි. ගිවිසුම් ප්‍රකාරව බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් එම කටයුතු අධීක්ෂණය හෝ නිරීක්ෂණ කිරීමක් ද සිදුකර නොනිබුණි.

5. නිරසාර සංවර්ධනය

5.1 නිරසාර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2030 නිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ අරමුණු 17 ක් යටතේ සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනාගෙන නිබුණු ඒ ඒ සංවර්ධන ක්‍රියාකාරකම්වල ජයග්‍රහණ දර්ශකවල අපේක්ෂිත ඉලක්කයන් හා වර්ෂයේ එම ඉලක්කයන් ළඟාකර ගැනීම සංඛ්‍යාත්මකව මැනිය හැකි නිශ්චිත දර්ශකයන් ලෙස (KPI) විගණනය වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ නිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේ කාර්යසාධනය විගණනයට නිශ්චිතව මැනිය නොහැකි විය.

5.2 සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2021

පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් 2021 සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු.9,521,994 ක ඇස්තමේන්තුවක් සහිත පාවහන් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය වෙනුවෙන් රු.7,374,853 ක ප්‍රතිපාදන වෙන්කර නිබුණ ද රු.873,967 ක් පමණක් පාවහන් ව්‍යාපෘතිය සඳහා වැයකර නිබුණි. තවද 2023 වර්ෂය සඳහා ද රු.1,268,463 ක ප්‍රතිපාදන වෙන්කලද පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම වර්ෂයේදී පාවහන් ව්‍යාපෘතිය සඳහා රු.376,057 ක මුදලක් පමණක් වැයකර නිබුණි.

මේ අනුව ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිපාදන උපරිමයෙන් වැයවන පරිදි ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාළ වගකිවයුත්තන්ගේ අපොහොසත් වී තිබුණු අතර සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ අපේක්ෂා කරන ලද අරමුණු ළඟා කර ගැනීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන තුලින් තම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සංවර්ධනය සඳහා දායක කරගැනීම ප්‍රශස්ථ මට්ටමක නොතිබුණු බවට නිරීක්ෂණය විය.

5.3 විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024

විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 යටතේ අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ලියාපදිංචි සමිති 10 ක් සඳහා නණකොළ කපන මැෂින් ලබා දීමට රු.300,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඉන් රු.280,000 ක වියදමින් නණකොළ කපන මැෂින් 14 ක් 2024 ජූලි 18 දින මිලදී ගෙන තිබුණි. මිල දී ගත් නණකොළ මැෂින් 05 ක් 2025 පෙබරවාරි වන විට මිලදී ගෙන මාස 07 ක් ගතවී තිබුණ ද ප්‍රතිලාභී සමිති සඳහා බෙදාහැරීමකින් තොරව කාර්යාලයේ ඉතිරිව පැවතුණි.

5.4 කඳුකර දශකය 2024 – 2033 දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කඳුකර දශකය 2024 – 2033 දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ හඳුන්වා දුන් ව්‍යාපෘති වෙනුවෙන් 2024 වර්ෂයේදී අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙනුවෙන් රුපියල් මිලියන 71 ක් වෙන්කර තිබුණු අතර ඉන් සියයට 43 ක ප්‍රතිපාදන පමණක් සමාලෝචිත වර්ෂයේදී වියදම් කර ව්‍යාපෘති 23 ක් ක්‍රියාත්මක කර තිබුණු අතර එම ක්‍රියාත්මක වූ ව්‍යාපෘති වලින්ද රුපියල් මිලියන 8.6 ක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. තවද, උක්ත වැඩසටහන යටතේ ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති 09 කට අදාල රුපියල් මිලියන 32 ක ප්‍රතිපාදන නැවත හරවා යැවීම සිදුකර තිබුණි. කඳුකර දශකය ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන්කර තිබූ සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 57 ක ප්‍රතිපාදන නැවත හරවා යැවීම සිදුකර තිබුණු අතර, එලෙස ලද ප්‍රතිපාදනයෙන් සියයට 50 කට වඩා වැඩි ප්‍රතිශතයක ප්‍රතිපාදන ආපසු හරවා යැවීමෙන් උක්ත ව්‍යාපෘතියේ අරමුණු/කරා ලහාවීමේ ශක්‍යතාවයක් දක්නට නොලැබුණි.

(ආ) කඳුකර දශකය විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ වූ ශෘණාශ්‍රිත ඵලවත් ඇති කිරීමේ වැඩසටහන සඳහා අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළ ප්‍රතිලාභී නාම ලේඛනය පශු වෛද්‍ය නිලධාරීන්ගේ නිර්දේශය සහිතව නැවත ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණ ද එම නිර්දේශයන් ලබා නොගැනීම හේතුවෙන් කළුතර දිස්ත්‍රික් ලේකම් බල ප්‍රදේශයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 න් අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පමණක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

5.5 ගම් සමග පිළිසඳරක් - සංවර්ධන වැඩසටහන -2022

පරිසර හා තිරසර සංවර්ධනය සඳහා වූ ගම් සමග පිළිසඳර - 2022 වැඩසටහන යටතේ පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා අනුමත කර නිවූ එකතුව රු.13,625,000 ක් වූ ව්‍යාපෘති යෝජනා 70 න් 40 ක් ම කොම්පෝස්ට් බඳුන් ලබාදීමේ ව්‍යාපෘති වූ අතර ඕ, කුඹුක්, කළුවර, කරද, සියඹලා ආදී විරල ගස් වර්ග සිටුවීම, ඖෂධ පැළ සිටුවා ඔසු උයන් ඇති කිරීම, මාර්ග හා ඇළ මාර්ග ආශ්‍රිත පැළ සිටුවා සංරක්ෂණය සඳහා ව්‍යාපෘති 20 ක් ද ඒ අතර විය. කෙසේ වුවද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රු.1,017,600 ක් වැය කර ප්ලාස්ටික් කොම්පෝස්ට් බඳුන් 159 ක් මිලදී ගෙන ප්‍රතිලාභීන් අතර බෙදා දී නිවුණු නමුත් පරිසර හා තිරසර සංවර්ධනය සඳහා වැදගත් වන අනුමත වූ ඉහත පැළ සිටුවීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොනිවුණි.

Priyadarshani

එස්.ඒ.ඩී.සී. ප්‍රියදර්ශනී
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

එස්.ඒ.ඩී.සී. ප්‍රියදර්ශනී
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය